# වාර්ෂික වාර්තාව
# வருடாந்த அறிக்கை
# Annual Report
# 2011











ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය
இலங்கை மலையக அபிவிருத்தி அதிகார சபை
Udarata Development Authority of Sri Lanka

ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
பொருளாதார அபிவிருத்தி அமைச்சு.
Ministry of Economic Development

# වාර්ෂික වාර්තාව


## வருடாந்த அறிக்கை

## Annual Report

# 2011

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 1. | දැක්ම සහ මෙහෙවර | 01 |
| 2. | හැඳින්වීම | 02 |
| 3. | සභාපතිතුමාගේ පණිවිඩය | 09 |
| 4. | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | 11 |
| 5. | කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය හා කාර්යභාරය | 12 |
| 6. | පාලන අංශය | 14 |
| 7. | සංවර්ධන අංශය | 15 |
| 8. | පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති | 36 |
| 9. | ඉදිකිරීම් අංශය | 40 |
| 10. | මූල්‍ය කළමනාකරණ අංශය | 46 |
| 11. | විගණකාධිපති වාර්තාව | 52 |



## දැක්ම

අභිමානයෙන් හා සෞභාග්‍යයෙන් සපිරි උඩරට දේශයක්...



## මෙහෙවර


උඩරට ප්‍රදේශයේ ජනතාවගේ සමාජ ආර්ථික සංවර්ධනය සඳහා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා මෙහෙයවීම.

# හැඳින්වීම

උඩරට ප්‍රදේශය තුළ සංවර්ධන ව්‍යාපෘති හඳුනාගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය හා මෙහෙයවීම සඳහා 2005 අංක 26 දරණ පාර්ලිමේන්තු පනත මගින් 2006 වර්ෂයේ මාර්තු මාසයේ දී ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය ස්ථාපිත කරන ලදි.

## අධිකාරියේ ක්‍රියාත්මක බල ප්‍රදේශය

- මධ්‍යම පළාත
  - i මහනුවර දිස්ත්‍රික්කය
  - ii මාතලේ දිස්ත්‍රික්කය
  - iii නුවරඑළිය දිස්ත්‍රික්කය
- සබරගමුව පළාත
  - i කෑගල්ල දිස්ත්‍රික්කය
  - ii රත්නපුර දිස්ත්‍රික්කය
- ඌව පළාත
  - i බදුල්ල දිස්ත්‍රික්කය
  - ii මොණරාගල දිස්ත්‍රික්කය
- නැගෙනහිර පළාත
  - i අම්පාර දිස්ත්‍රික්කයේ ;
    - ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
    - පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය
    - මහඔය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය



## බල ප්‍රදේශයේ මූලික දත්ත

| අනු අංකය | පළාත | දිස්ත්‍රික්කය | ප්‍රා/ලේ කොට්ඨාශ සංඛ්‍යාව | ග්‍රා/නි වසම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මධ්‍යම | මහනුවර | 20 | 1,188 |
| | | මාතලේ | 11 | 545 |
| | | නුවරඑළිය | 5 | 491 |
| 02 | සබරගමුව | කෑගල්ල | 11 | 573 |
| | | රත්නපුර | 17 | 575 |
| 03 | ඌව | බදුල්ල | 15 | 567 |
| | | මොණරාගල | 11 | 319 |
| 04 | නැගෙනහිර | අම්පාර | 3 * | 49 |
| | **එකතුව** | | **93** | **4307** |


* අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක් පමණක් අයත්වේ

## 2009 වසරේ සිට නම් කළ බල ප්‍රදේශය

සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කළයුතු බල ප්‍රදේශය වශයෙන් මහනුවර දිස්ත්‍රික්කයේ පහත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 2009 වසරේ සිට නම් කර ඇත.

- ගලගෙදර
- හතරලියද්ද
- හාරිස්පත්තුව
- පූජාපිටිය
- අකුරණ

} ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ



## නම් කළ බල ප්‍රදේශයෙහි දත්ත වාර්තාව

| ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය | විශාලත්වය ව.කි.මී | වසම් ගණන | ගම්මාන සංඛ්‍යාව | මුළු ජනගහනය | පවුල් සංඛ්‍යාව | සමෘද්ධිලාභී පවුල් ගණන |
|---|---|---|---|---|---|---|
| හතරලියද්ද | 62.00 | 57 | 112 | 31650 | 9802 | 3400 |
| ගලගෙදර | 54.00 | 67 | 141 | 39620 | 10548 | 3512 |
| හාරිස්පත්තුව | 59.00 | 84 | 148 | 92007 | 23501 | 8043 |
| පූජාපිටිය | 50.40 | 67 | 120 | 62477 | 15285 | 5275 |
| අකුරණ | 31.30 | 35 | 113 | 66759 | 13491 | 5221 |
| **එකතුව** | **256.70** | **310** | **634** | **292513** | **72627** | **25451** |

## නම් කළ බල ප්‍රදේශයේ තොරතුරු පිළිබඳ වාර්තාව

| අනු අංකය | ප්‍රදේශිය ලේකම් කොට්ඨාශය | පාසල් | පන්සල් | | පල්ලි | | කෝවිල් සංඛ්‍යාව | කලායතන සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| | | පාසල් සංඛ්‍යාව | පන්සල් සංඛ්‍යාව | දහම් පාසල් සංඛ්‍යාව | මුස්ලිම් පල්ලි | ක්‍රිස්තියානි පල්ලි | | |
| 1 | හතරලියද්ද | 22 | 31 | 31 | 2 | - | 1 | 6 |
| 2 | ගලගෙදර | 20 | 36 | 28 | 3 | 2 | - | 5 |
| 3 | හාරිස්පත්තුව | 28 | 65 | 55 | 11 | - | - | 14 |
| 4 | පූජාපිටිය | 29 | 59 | 44 | 13 | 1 | 2 | 4 |
| 5 | අකුරණ | 26 | 16 | 17 | 57 | - | 6 | 1 |
| **එකතුව** | | **125** | **207** | **175** | **86** | **3** | **9** | **30** |

**අපගේ ප්‍රධාන සංවර්ධන සංරචකයන්**

**ජීවනෝපාය සංවර්ධනය**

**යටිතල පහසුකම් සංවර්ධනය**

**ආධ්‍යාත්මික සංවර්ධනය**

# අරමුණු හා පරමාර්ථ

**(2005 අංක 26 දරණ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරී පනත II පරිච්ඡේදයට අනුව)**

**(අ)** බල ප්‍රදේශය තුළ නිෂ්පාදනශීලීත්වය නංවාලීමට ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ පාරිසරික සංවර්ධනය වැඩි දියුණු කිරීමට හා ආදායම් ඉහළ නැංවීමට මෙන්ම රැකියා අවස්ථා උත්පාදනය කිරීමට යම් නම් කළ ප්‍රදේශයක් තුළ සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

**(ආ)** නම් කළ බල ප්‍රදේශය සඳහා වූ සමස්ත සංවර්ධන සැලසුමෙහි දී හඳුනාගෙන ඇති ව්‍යාපෘති පිළිබඳව විස්තරාත්මකව අධ්‍යයනය කිරීම.

**(ඇ)** ඓතිහාසික, සමාජීය සහ වෙනත් හේතු නිසා කොන් වී සිටින ජන කොටස් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ සමාජීය සහ ආර්ථික තත්ත්වය නැංවීමට යෝජනා සකස් කිරීම, අරමුදල් රැස් කිරීම සහ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම.

**(ඈ)** මහනුවර නගරයේ, ඓතිහාසික වැදගත්කම සහ ජාතික වශයෙන් එහි ඇති සංස්කෘතික හා ආර්ථික වැදගත්කම සැලකිල්ලට ගනිමින්, මහනුවර නගරය සහ එහි උරුමය ද, සංස්කෘතික ආයතන ද, පරිසරය සහ යටිතල පහසුකම් ද සංරක්ෂණය කිරීම කෙරෙහි විශේෂ අවධානය ව්‍යාප්ත කිරීම.

**(ඉ)** යම් නම් කළ ප්‍රදේශයක් තුළ (ආ) ඡේදයේ සඳහන් කර ඇති අධ්‍යයන කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී, රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, පළාත් සභා බලධරයන්ගෙන් සහ ස්වභාවික හා නෛතික වුව ද, පෞද්ගලික හා රාජ්‍ය වුව ද වෙනත් පුද්ගලයන්ගෙන් ද සහයෝගිත්වය ලබා ගැනීම.

**(ඊ)** යම් නම් කළ ප්‍රදේශයක් තුළ (ආ) ඡේදයේ සඳහන් කර ඇති, විස්තරාත්මකව අධ්‍යයනය කිරීමේ දී සහ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දේශීය, විදේශීය හා පුද්ගලික අංශ නියෝජ්‍යායතනවල සහභාගිත්වය ලබා ගැනීම.

# සංවිධාන ව්‍යුහය හා සේවක මණ්ඩලය.

2006.04.01 දින සිට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ පරමාර්ථ හා කාර්යභාරය ඉටු කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් වරින්වර අනුමත කර ඇති අධිකාරියේ ස්ථිර කාර්ය මණ්ඩලයේ සංයුතිය 2011 වසර වන විට කාර්ය මණ්ඩල සාමාජිකයින් 50 කින් සමන්විත විය.

# ආයතනික කාර්ය මණ්ඩලය

| අනු අංකය | තනතුර | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති කාර්ය මණ්ඩලය | දැනට සේවයේ නිරත කාර්ය මණ්ඩලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | |
| 02 | අධ්‍යක්ෂ (සංවර්ධන) | 01 | 01 | |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන හා මුදල්) | 01 | - | |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) | 01 | - | |
| 05 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) | 02 | 01 | එක් නිලධාරියෙකු වැඩතහනමට ලක්ව් ඇත. |
| 06 | සහකාර අධ්‍යක්ෂ(සංවර්ධන) | 02 | 01 | එක් නිලධාරියෙකු විදේශගතව ඇත. |
| 07 | සහකාර අධ්‍යක්ෂ (පශු සම්පත්) | 01 | 01 | |
| 08 | සිවිල් ඉංජිනේරු | 01 | 01 | |
| 09 | ගණකාධිකාරි | 01 | - | වැඩතහනමට ලක්ව් ඇත. |
| 10 | පරිපාලන නිලධාරි | 01 | 01 | |
| 11 | ගිණුම් සහකාර | 01 | 01 | |
| 12 | සංවර්ධන සහකාර | 03 | 03 | |
| 13 | කාර්මික නිලධාරි(1 ශ්‍රේණිය) | 1 | - | |
| 14 | කාර්මික නිලධාරි | 04 | 04 | |
| 15 | කළමනාකරණ සහකාර | 13 | 13 | |
| 16 | රියදුරු | 08 | 08 | |
| 17 | කාර්යාල කාර්ය සහායක (I, II, III) | 05 | 04 | |
| 18 | කාර්යාල කම්කරු | 03 | 03 | |
| | එකතුව | 50 | 43 | |


2011 වසරේ ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ස්ථිර කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවූ බැවින් කොන්ත්‍රාත් පදනම මත, දෛනික පදනම මත හා සේවා මිලදී ගැනීම් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සිදු වූ අතර ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරියේ පුහුණු අභ්‍යාසලාභීන් 18 දෙනෙකුගේ සහාය ද 2011 වසරේ දී ලබා ගන්නා ලදී.

ඒ අනුව 2011 වසරේ දී ආයතනයේ සේවයේ නිරත වූ ස්ථිර නොවන කාර්ය මණ්ඩලය පහත දැක්වෙන පරිදි වේ.

**2011 ස්ථිර නොවන කාර්ය මණ්ඩලය**

| අනු අංකය | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|
| කොන්ත්‍රාත් පදනම මත | | |
| 01 | කාර්මික නිලධාරි | 01 |
| 02 | කළමනාකරණ සහකාර | 06 |
| 03 | කාර්යාල කාර්ය සහායක | 01 |
| දෛනික පදනම මත | | |
| 01 | කළමනාකරණ සහකාර | 01 |
| 02 | රියදුරු | 02 |
| සේවා මිලදී ගැනීම | | |
| 01 | මුරකරු | 02 |
| පුහුණු පදනම මත | | |
| 01 | පුහුණු අභ්‍යාසලාභීන් | 18 |
| **එකතුව** | | **31** |

# සංවිධාන ව්‍යුහය



සභාපති
කළමනාකරණ මණ්ඩලය
අධ්‍යක්ෂ ජනරාල්
අධ්‍යක්ෂ සංවර්ධන
නි.අධ්‍යක්ෂ පාලන හා මුදල්
නි.අධ්‍යක්ෂ සැලසුම්
සිවිල් ඉංජිනේරු
ගණකාධිකාරි
ස. අධ්‍යක්ෂ සැලසුම්
ස. අධ්‍යක්ෂ සංවර්ධන
ස. අධ්‍යක්ෂ සංවර්ධන
ස. අධ්‍යක්ෂ පශු සම්පත්
පරිපාලන නිලධාරි
මූල්‍ය සහකාර
සංවර්ධන සහකාර
සංවර්ධන සහකාර
කාර්මික නිලධාරි
කළමනාකාර සහකාර
කළමනාකාර සහකාර
කළමනාකාර සහකාර
කළමනාකාර සහකාර
කළමනාකාර සහකාර
කළමනාකාර සහකාර
රියදුරු
කා.කා.ස / කම්කරු

# සභාපතිතුමාගේ පණිවිඩය



**"2005 අංක 26 දරණ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරි පනත"** මගින් ස්ථාපිත කරන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය උඩරට ප්‍රදේශය තුළ පවත්නා සම්පත්, ශක්තීන් හා විභවතා හඳුනාගනිමින් නව සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය යන මෙහෙවර සාක්ෂාත් කරමින් 2006 වසරේ සිට විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලැබේ.

ඉසුරුමත් නිවහනක් අසිරිමත් මව්බිමක් ගොඩනැගීමේ පරමාර්ථයෙන් අතිගරු ජනාධිපතිතුමාගේ උපදේශකත්වයෙන් හා ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ මග පෙන්වීම යටතේ දියත් කෙරෙන දිවි නැගුම වැඩසටහනට දායක වෙමින් අධිකාරියෙහි නම් කළ බල ප්‍රදේශය වන මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියද්ද, ගලගෙදර,, හාරිස්පත්තුව, පූජාපිටිය අකුරණ, යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් 2011 වසරේ දී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදි. මෙහිදී විශේෂයෙන්ම ප්‍රතිලාභී ජනතාවගේ ජීවනෝපාය මාර්ගයන් වැඩිදියුණු කිරීම සඳහා විවිධ ස්වයං රැකියාවක් හඳුන්වා දීම, මගපෙන්වීම අවශ්‍ය පුහුණුව හා යෙදවුම් ලබාදීමට විශේෂ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරනු ලැබිය. ගෙවතු වගාව, විසිතුරු පත්‍ර වගාව, බිම්මල් නිෂ්පාදනය, රූපලාවන්‍ය උපකරණ ලබාදීම, බෙහෙත් පෙති කවර නිෂ්පාදනය, පැළ තවාන් ආරම්භ කිරීම, කහ ඉඟුරු වගාව, මී මැසි පාලනය, කිරිගව පාලනය, එළු පාලනය, කුකුළු පාලනය යන ව්‍යාපෘති සඳහා මෙහිදී මූලික අවධානය යොමුවිය.

කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා පුරන් වූ කුඹුරු යළි වගා කිරීමට අවශ්‍ය සුළු වාරිමාර්ග ඉදිකිරීම මෙන්ම ග්‍රාමීය කෘෂි බෝග ප්‍රවාහනය පහසු කිරීමට කෘෂි මාර්ග සංවර්ධනය සඳහා ද පසුගිය වසරේ දී විශේෂ අවධානය යොමු කරන ලදි.

ආර්ථික වශයෙන් මෙන්ම ආධ්‍යාත්මික වශයෙන් ද අදාළ ප්‍රජාව සංවර්ධනය කිරීම උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාවට නංවනු ලැබිය. ඒ අතර පාසැල් දරුවන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයට නැඹුරු කිරීම සඳහා පාසැල් පාරිසරික වැඩසටහන, ඔසු උයන් ස්ථාපනය, නව දහම් පාසල් ආරම්භය හා පවත්නා දහම් පාසැල් සංවර්ධනය, පෙර පාසැල් සංවර්ධනය, මතට තිත මත් නිවාරණ වැඩසටහන්, කලායතන සංවර්ධනය, ආකල්ප සංවර්ධන වැඩසටහන්, නායකත්ව පුහුණු වැඩසටහන්, සතිපාරක්ෂ හා සෞඛ්‍ය වැඩසටහන්, ළමා, කාන්තා හා වැඩිහිටියන්ගේ සුබ සාධන වැඩසටහන්, මාපිය ගුණ සැමරුම්, ධර්ම දේශනා හා බෝධිපූජාමය පිංකම් පැවැත්වීම ආදී වැඩසටහන් රැසක් 2011 වසරේ දී ක්‍රියාත්මක කරනු ලැබිය.

2011 වසර සඳහා මූල්‍ය ප්‍රතිපාදන අනුමතවීම වසරේ අගභාගයේ එනම් සැප්තැම්බර් මාසයේ සිදු වුව ද රුපියල් මිලියන 192ක් එනම් ලද ප්‍රතිපාදනවලින් 90% ක් සංවර්ධන කටයුතු සඳහා සාර්ථකව වැය කිරීමට හැකිවිය. එමෙන්ම 2007 වසරේ සිට ආරම්භ කරන ලද මෙතෙක් අවසන් නොකළ ව්‍යාපෘති රැසක් 2011 වසරේ නැවත ආරම්භ කර අවසන් කිරීමට හැකිවිය. බඳුල්ල බෝගහ කුඹුර තැන්නේ කුඹුර කෘෂි මාර්ගය, අකුරණ උඩවැලිකැටිය පාලම හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම, දංගොල්ල මවුන්ට්ප්‍රසන්ට් වත්ත පාර යන ව්‍යාපෘති මෙසේ නිම කිරීමට හැකිවිය. නව ද හතරලියද්ද වීවල පාලම, හියාරාපිටිය හොරේකොටේ

මාර්ගය, අකුරණ සිත්තෝඩය පාලම, කොත්මලේ මල්ලන්ද, මාවෙල, නව තිස්පනේ යන ස්ථානවල ඉදිකරන ලද බහුකාර්ය ගොවැගිලි ආදී නිම නොකරන ලද ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු නැවත ආරම්භ කර 60% ක් පමණ නිම කිරීමට හැකි වූ අතර 2012 වසරේ මෙම ව්‍යාපෘති ද නිම කර ජනතා අයිතියට පැවරීමට බලාපොරොත්තු වේ.

මේ අයුරින් 2010 වසරේ අපේක්ෂිත සංවර්ධන ඉලක්ක සපුරාගනිමින් ජාතික සංවර්ධනයට ඉවහල්වන ග්‍රාමීය හා ප්‍රාදේශිය සංවර්ධන ව්‍යාපෘති රැසක් සාර්ථකව නිම කිරීම සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍ය ගරු බැසිල් රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අමාත්‍යාංශ ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලය ද, අප අධිකාරියේ සමස්ත කාර්ය මණ්ඩලය ද, අදාළ කොට්ඨාශවල සියලුම සහායක ආයතනවල නිලධාරීන් ද දෙන ලද සහාය පිළිබඳව අතිශයින් ස්තුතිවන්ත වෙමි.

අමරනන්ද වීරසිංහ

සභාපති,

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

යටත්විජිත ආධිපත්‍යයට නතුවූ උඩරට ප්‍රදේශයෙහි ජනතාවට සිදුවූ සමාජ ආර්ථික හා වෙනත් විවිධ දුෂ්කරතාවයන්ට තිරසාර විසදුම් ලබාදීමටත් එම ප්‍රදේශයේ සංවර්ධනය කඩිනම් කර වේගවත් සංවර්ධනයක් ඇති කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ ගමන් මඟෙහි වස්වන වසර වන 2011 වසරේ දී සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක කරන ලදි. අධිකාරිය සතු සම්පත් මෙන්ම ප්‍රාදේශියව පවත්නා සම්පත් හා විභවයන් හඳුනා ගනිමින් ඒවා හැකි උපරිමයෙන් උපයෝගී කරගනිමින් ඉතා පුළුල් දැක්මක් සහිතව විවිධ සංවර්ධන වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කර ඉතා ඉහළ ප්‍රතිඵල ළඟාකර ගැනීමට සමත් විය..

ඒ අනුව විශේෂයෙන්ම ජීවනෝපාය සංවර්ධනය ඉලක්ක කරගනිමින් බල ප්‍රදේශයට අයත් එක් එක් ප්‍රදේශයන්හි පවත්නා අවස්ථා, ගැටලු මෙන්ම පසුගාමී අංශ, ප්‍රතිලාභී කණ්ඩායම්, සමිති සංවිධාන පිළිබඳව විශේෂයෙන් සලකා බලා සංවර්ධන වැඩසටහන් සැළසුම් කර ක්‍රියාත්මක කිරීමට පියවර ගනු ලැබීය.

මෙම සංවර්ධන ක්‍රියාවලිය මඟින් 2011 වසරේ රටේ ප්‍රමුඛ සංවර්ධන වැඩසටහන වන **දිවි නැගුම** වැඩසටහනට ප්‍රමුඛත්වය දෙමින් ප්‍රජාවගේ සමාජ ආර්ථික, ජීවන තත්ත්වය උසස් කිරීමට සෘජුව හා වක්‍රව ඉවහල් වන ග්‍රාමීය මට්ටමේ හඳුනාගත් ව්‍යාපෘති රැසක් ක්‍රියාවට නංවනු ලැබීය. එහිදී ග්‍රාමීය සුළු වාරිමාර්ග හා කෘෂි මාර්ග සංවර්ධනය, විවිධ ස්වයං රැකියාවක් හඳුන්වා දීම, මහපෙන්වීම අවශ්‍ය පුහුණුව හා යෙදවුම් ලබාදීම. ගෙවතු වගාව, විසිතුරු පත්‍ර වගාව, බිම්මල් නිෂ්පාදනය, රූපලාවන්‍ය උපකරණ ලබාදීම, බෙහෙත් පෙති කවර නිෂ්පාදනය, පැල තවාන් ආරම්භ කිරීම, කහ ඉඟුරු වගාව, මී මැසි පාලනය, කිරිගව පාලනය, එළු පාලනය, කුකුළු පාලනය වැනි ව්‍යාපෘති විශේෂයෙන් හැදින්විය හැකිය.

පුද්ගලයාගේ අධ්‍යාත්මික සංවර්ධනයට විශේෂ ස්ථානයක් ලබා දෙමින් නව දහම් පාසල් ආරම්භය හා පවත්නා දහම් පාසැල් සංවර්ධනය, පෙර පාසැල් සංවර්ධනය, මතට තිත මත් නිවාරණ වැඩසටහන්, කලායතන සංවර්ධනය, ආකල්ප සංවර්ධන වැඩසටහන්, නායකත්ව පුහුණු වැඩසටහන්,හා ජීවනෝපාය සංවර්ධනය යන ව්‍යාපෘතින් රැසක් ඉතා අර්ථවත් හා ඵලදායි ලෙසින් ක්‍රියාත්මක කරන ලද අතර ජීවනෝපාය හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ආයෝජනය කරන ලද මුදල රුපියල් මිලියන 192 ඉක්මවයි.

එමෙන්ම දිස්ත්‍රික්ක අටකින් සමන්විත අධිකාරි බල ප්‍රදේශය තුළ මීට ඉහත වර්ෂවල ආරම්භ කර ක්‍රියාත්මක කරන ලද නමුත් වැඩ නිම නොකරන ලද විවිධ සංවර්ධන ව්‍යාපෘති පිළිබඳව අධ්‍යයනය කර 2009 ,2010 වසරවල දි ව්‍යාපෘති කිහිපයක වැඩ අවසන් කරන ලද අතර ඉතිරි සංවර්ධන ව්‍යාපෘතිවල කටයුතු 2011වසරේ දී නිම කිරීමට කටයුතු කරන ලදි.

ඒ අනුව මෙම අධිකාරිය පිහිටුවීමේ පරමාර්ථය වන ප්‍රාදේශීය සංවර්ධනය වඩා වේගවත් කර ග්‍රාමීය ප්‍රදේශවල කඩිනම් සංවර්ධනයක් සඳහා ඉතා සංවිධානාත්මකව හා කාර්යක්ෂමව මැදිහත් වී උඩරට ජනතාවට නවෝදයක් ඇති කිරීමට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය 2011 වසරේ ද සිය මෙහෙවර ක්‍රියාත්මක කරන ලදි.

එස්. එම්. එස්. පී. සමරකෝන්

අධ්‍යක්ෂ ජනරාල්

# කළමනාකරණ මණ්ඩලය

## i හැඳින්වීම

අධිකාරියේ පරමාර්ථ හා අරමුණු ක්‍රියාවට නැංවීමට අවශ්‍ය සියලු තීරණ ගැනීම හා අධිකාරියේ සියලු කටයුතු කළමනාකරණය කිරීම කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇති කාර්යභාරය වන අතර අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන 08 (අට) පුද්ගල සාමාජිකත්වයකින් මෙම කළමනාකරණ මණ්ඩලය සමන්විත වේ.

## ii කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය *(පනතේ පළමු වන පරිච්ඡේදයේ හතරවන වගන්තියේ සඳහන් වන පරිදි)*

**i. නිල බලයෙන් පත්වන සාමාජික සංඛ්‍යාව - 03 (තිදෙනෙකු)**

(උඩරට සංවර්ධන විෂයභාර අමාත්‍යාංශයේ ලේකම්වරයා, මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාගේ තත්ත්වය දරණ නිලධාරියෙකු, වතු යටිතල පහසුකම් විෂයභාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන නිලධාරියෙකු)

**ii. පත් කළ සාමාජිකයින් - 05 (පස්දෙනෙකු)**

(විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන සාමාජිකයින්)

***03. කළමනාකරණ මණ්ඩලයේ සමාජිකත්වය 2011 වර්ෂය***

| අනු අංකය | සාමාජිකයාගේ නම | සාමාජිකත්වයේ ස්වභාවය | | පත් වූ දිනය | ඉවත් වූ දිනය | නැවත පත් කළ දිනය |
|---|---|---|---|---|---|---|
| 01 | අමරනන්ද වීරසිංහ මහතා | පත් කළ සාමාජික | සභාපති/ කළමනාකරණ මණ්ඩල සාමාජික | 2008.12.31 | - | |
| 05 | එස්. ආර්. කරුණාරත්න මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2009.01.20 | 2010.06.04 | 2010 .08.19 |
| 06 | කේ.ජී.කේ විමලවීර මහත්මිය (අධ්‍යක්ෂ) | නිල බලයෙන් පත්වන | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010 .09.15 | - | |
| 07 | අසංක බණ්ඩාර දොඩංවල මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010 .08.19 | 2011.09.16 | |
| 08 | අබ්දුල් වහිඩ් මොහොමඩ් මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010 .08.19 | - | |
| 09 | වොල්ටර් රණසිංහ මහතා | පත් කළ සාමාජික | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2010 .08.19 | - | |
| 10 | සීතා සේනාරත්න මහත්මිය | නිල බලයෙන් පත්වන | කළමනාකරණ මණ්ඩල සාමාජික | 2011.02.09 | 2011.12.02 | |

## 04. කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇති බලතල

මෙම අධිකාරියේ පරමාර්ථ ක්‍රියාවට නැංවීමේ කාර්ය සඳහා "ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනත" මගින් කළමනාකරණ මණ්ඩලය වෙත පුළුල් බලතල ලබා දී ඇත. පනතේ II වන පරිච්ඡේදයේ එම බලතල දීර්ඝ වශයෙන් විස්තර කොට දැක්වේ. මෙකී බලතලවලට අනුව උඩරට ප්‍රදේශය තුළ නිෂ්පාදනශීලීත්වය නංවා ලීම, ආදායම් හා රැකියා අවස්ථා උත්පාදනය සඳහා මෙන්ම පොදුවේ ආර්ථික සමාජයීය, සංස්කෘතික හා පාරිසරික සංවර්ධනය වැඩිදියුණු කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම සම්බන්ධව විධිවිධාන සැලැස්වීමට බලය කළමනාකරණ මණ්ඩලය වෙත පැවරී ඇත.

## 05. කළමනාකරණ මණ්ඩලය විසින් 2011 වර්ෂය තුළදී ගෙන ඇති තීරණ පිළිබඳ සංක්ෂිප්ත සටහනක්

2011 වර්ෂයේ දී කළමනාකරණ මණ්ඩල රැස්වීම් 13 ක් පවත්වා ඇති අතර. මෙම රැස්වීම්වල දී විශේෂ අවධානයක් අධිකාරියේ මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත් කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන අනුමත කිරීමට මෙන්ම අධිකාරියට අත්‍යවශ්‍ය මානව හා භෞතික සම්පත් සපුරා ගැනීමට අවශ්‍ය තීරණ ගැනීම වෙත යොමු කර තිබේ.

- ජනමාධ්‍ය දැනුවත් කිරීමේ සාකච්ඡාවක් පැවැත්වීම
- මුදල් රෙගුලාසිවලට අනුව වියදම් කිරීම හා බලය බෙදීම අනුමත කිරීම
- අයවැය ඇස්තමේන්තුව අනුමත කර ගැනීම
- සංවර්ධන සැලැස්ම අනුමත කර ගැනීම
- පුරප්පාඩු වී තිබූ සිවිල් ඉංජිනේරු, සහකාර අධ්‍යක්ෂ (පශු සම්පත්) ,කාර්යාල කාර්ය සහායක යන තනතුරුවලට බඳවා ගැනීම අවශ්‍ය තීරණ ගැනීම.
- වර්ෂයට අදාළ වැය විෂයයන් සංශෝධනය කිරීම
- නොනිමි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අදාළ උපදෙස් ලබාදීම.
- ජීවනෝපාය හා අධ්‍යාත්මික කඩිනම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.
- පැල අලෙවි මධ්‍යස්ථානයක් ඉදිකිරීමට අනුමැතිය ලබාදීම.
- සත්ව සංවර්ධන වැඩසටහන් සඳහා සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගනිමින් පශු සම්පත් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම.
- මාසිකව ඉදිරිපත් කරන පුනරාවර්තන හා ප්‍රාග්ධන හා විවිධ ආදායම් වාර්තා අනුමත කර ගැනීම
- ගෘහස්ථ ආර්ථිකය දියුණු කිරීම සඳහා සංවර්ධන කටයුතු විධිමත් කිරීමට උපදෙස් ලබාදීම.
- අධිකාරියට අවශ්‍ය නිතිඥ මණ්ඩලය පත් කර ගැනීම
- විදේශ ශිෂ්‍යත්ව සඳහා නිලධාරින් යොමු කිරීමට අනුමැතිය ලබාදීම.
- පාසැල් පාරිසරික සංවර්ධන වැඩසටහන, කහ ඉඟුරු වගා කිරීමේ ව්‍යාපෘතිය ආදී ව්‍යාපෘති සඳහා අනුමැතිය ලබාදීම.
- නොනිමි ව්‍යපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදීම.
- ජීවනෝපාය හා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් හා අනුමැතිය ලබාදීම

# පාලන අංශය

ආයතනය තුළ සියලුම මානව හා භෞතික සම්පත් නිසි පරිදි කළමනාකරණය කරමින් ආයතනයේ පරිපාලනය සහ සංවර්ධන කටයුතුවලට අවශ්‍ය දායකත්වය පාලන අංශය මගින් 2011 වසරේ දී ලබා දෙන ලදී.

## කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් -2011

ආයතනය වෙත පවරන ලද සියලු වගකීම් නිසි ආකාරව ඉටු කිරීම සඳහා මානව සම්පත සතු දැනුම වැඩි දියුණු කර ගැනීමට 2011 වසරේ පහත පුහුණු වැඩසටහන් සඳහා කාර්ය මණ්ඩලය යොමු කිරීමට කටයුතු කරන ලදී.

- කොරියාවේ හොංකොං ජාතික විශ්ව විද්‍යාලය මගින් පවත්වනු ලබන කෘෂිකර්මය හා පශ්චාත් උපාධි පාඨමාලාව
- ප්‍රසම්පාදන පුහුණු වැඩසටහන
- පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම
- ලිපි ලිවීම සහ ලිඛිත සන්නිවේදනය
- Internet & Emil
- කාල කළමනාකරණය
- ඡායාරූප ලබා ගැනීම පිළිබඳ පුහුණු වැඩසටහන
- E – Government
- ගිණුම්කරණය පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන

මෙම පුහුණු පාඨමාලාවන් පැවැත්වීමෙහි මූලික අරමුණ වන්නේ කාර්ය මණ්ඩලයට තමා නියැලී සිටින රාජකාරි ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් දැනුමක් ලබාදීමයි. එමෙන්ම රාජකාරි කටයුතු සඳහා ඔවුන් පෙළඹවීම හා වඩා කාර්යක්ෂමව එම කටයුතු ඉටුකර ගැනීම ද ප්‍රධාන අරමුණකි. තව ද බාහිර ආයතනවලින් යම් ගෙවීමක් මත ලබා ගන්නා යම් යම් සේවාවන් ආයතනය තුළම ඉටුකර ගැනීමට මෙම පුහුණු වැඩසටහන් ඉවහල්වේ.

ආයතනය සතු මානව සම්පත නිසි පරිදි කළමනාකරණය කරමින් ආයතනයේ පරිපාලන හා අපේක්ෂිත සංවර්ධන කටයුතු සාර්ථකව ඉටු කිරීමට පාලන අංශය මගින් 2011 වසරේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරන ලදී.

# සංවර්ධන අංශය

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියට අයත් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම සංවර්ධන අංශය වෙත පැවරී ඇති කාර්යභාරයයි. අධිකාරියේ ප්‍රධාන සංරචක 03 වන යටිතල පහසුකම් සංවර්ධනය, ආර්ථික ජීවනෝපාය සංවර්ධනය හා අධ්‍යාත්මික සංවර්ධනයට අදාළ ව්‍යාපෘති මෙහිදී ක්‍රියාත්මක කරන ලැබේ. 2011 වසරේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් කෙරෙහි මූලික අවධානය යොමු කරන ලද අතර පහත දැක්වෙන වැඩසටහන් ඒ යටතේ ක්‍රියාත්මක කරන ලදි.

## <u>ජීවනෝපාය සංවර්ධනය</u>

### 1. <u>දැනුවත්කිරීමේ වැඩසටහන්</u>

- 2011 වර්ෂයේ ජනවාරි මස තුළදී අධිකාරියට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි කාන්තා සමිති සඳහා නව සාමාජිකයන් බඳවාගැනීමට කටයුතු කිරීම සහ සංවර්ධන යෝජනා හඳුනා ගැනීමට කටයුතු කිරීම.
- 2011 වර්ෂයේ ජාතික සංවර්ධන වැඩසටහන වන දිවි නැගුම වැඩසටහන පිළිබඳව සහ 2010 වර්ෂයේ අධිකාරියේ සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය පිළිබඳව මාධ්‍යවේදීන් දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සාකච්ඡාවක් පැවැත්වීම.




- ආර්ථික සංවර්ධන ගරු අමාත්‍ය බැසිල් රාජපක්ෂ මැතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේදී පැවති සාකච්ඡාව.

- හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ යන නම් කරන ලද බල ප්‍රදේශයේ සියලු සහය සේවා ආයතනවල නිලධාරීන් දැනුවත් කිරීම (දිවි නැගුම වැඩසටහන)





දිවිනැගුම වැඩසටහන - ගලගෙදර



දිවිනැගුම වැඩසටහන - හතරලියද්ද

පැවති දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහනෙහි සමාරම්භක අවස්ථාව.



දිවිනැගුම වැඩසටහන - හාරිස්පත්තුව



දිවිනැගුම වැඩසටහන - පූජාපිටිය

- ❖ පැලනවාන්කරුවන් 52 ක් දැනුවත් කිරීමේ වැඩසටහන
- ❖ අපනයන සංවර්ධන මණ්ඩලය සම්බන්ධ කර ගනිමින් විසිතුරු පත්‍ර සහ ඇන්තුරියම් මල් වගාව ප්‍රචලිත කිරීමේ මූලික සාකච්ජාව.
- ❖ පාසැල් පාරිසරික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ නුගවෙල මධ්‍ය මහා විද්‍යාලයේදී පැවති මූලික සාකච්ජාව.

- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 59 දෙනෙකු සඳහා ඇන්තූරියම් හා විසිතුරු පත්‍ර වගාව පිළිබඳ දැනුවත් කිරීම.
- බල ප්‍රදේශයේ රැකියා විරහිත තරුණියන් සඳහා ස්වයං රැකියාවක් වශයෙන් රූපලාවන්‍යාගාර ආරම්භ කිරීම කිරීම සඳහා තෝරාගත් ප්‍රතිලාභීන් දැනුවත් කිරීම.
- ජීවනෝපාය හා ආධ්‍යාත්මික කඩිනම් සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව බල ප්‍රදේශයේ දේශපාලන අධිකාරිය හා රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම.

## 2 පුහුණු වැඩසටහන්

- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 394 ක සහභාගිත්වයෙන් කහ ඉගුරු වගාව ප්‍රචලිත කිරීම අරමුණු කරගෙන පවත්වන ලද පුහුණු වැඩසටහන.

- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ශ්‍රී විසුද්ධාරාම විහාරස්ථානයේදී ප්‍රතිලාභීන් 19 කගේ සහභාගීත්වයෙන් කහ ඉගුරු වගාව ප්‍රචලිත කිරීම අරමුණු කොටගෙන පුහුණු වැඩසටහන් පැවැත්වීම (ඡායාරූප අංක 1 හා 2)



(1)



(2)

- ගලගෙදර ප්‍රාදේශීය ගොවිජන සේවා කාර්යාලයේදී ප්‍රතිලාභීන් 190 දෙනෙකුගේ සහභාගීත්වයෙන් කහ සහ ඉගුරු වගාව ප්‍රචලිත කිරීම අරමුණු කොටගෙන පවත්වන ලද පුහුණු වැඩසටහන.

- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 12 දෙනෙකු සඳහා රාජකීය උද්භිද උද්‍යානයේදී ඇන්තූරියම් වගා පුහුණුව ලබා දීමේ වැඩසටහනක් පැවැත්වීම.

- මාතලේ ග්‍රීනෙට් ප්ලාන්ට් ඇන්ඩ්ස් පැළ තවානේදී ප්‍රතිලාභීන් 53 දෙනෙකු සඳහා විසිතුරු මල් පත්‍ර වගාව පිළිබඳ ප්‍රායෝගික හා න්‍යායික පුහුණුව ලබා දීමේ වැඩසටහන පැවැත්වීම (ඡායාරූප අංක 1 හා 2).



(1)



(2)

- ❖ ග්‍රාමීය සුළු කර්මාන්ත සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 100 ක් පුහුණු කිරීම.

- ❖ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වෙමින් හතරලියද්ද, ගලගෙදර, පූජාපිටිය, අකුරණ,, ගොවිජන මධ්‍යස්ථානවලදී පැළ තවාන්කරුවන් පුහුණු කිරීම.

- ❖ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වෙමින් පැළ තවාන්කරුවන් සවිබල ගැන්වීමේ ව්‍යාපෘතිය යටතේ හතරලියද්ද උඩුව එම්.බී. තෙන්නකෝන් මහතාගේ පැළ තවානේදී ප්‍රතිලාභීන් 13 දෙනෙකු පුහුණු කිරීම (ඡායාරූප අංක 1 හා 2).



(1)



(2)

- ❖ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලවතුගොඩ කොනකලගල විජිත මහා විහාරස්ථානයේදී දහම් පාසල් ශිෂ්‍ය නායක නායිකාවන් 52 දෙනෙකු සඳහා නායකත්ව පුහුණු වැඩසටහන පැවැත්වීම.

- ❖ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 31 දෙනෙකු සඳහා මී මැසි පාලනය සම්බන්ධ පුහුණු වැඩසටහන පැවැත්වීම.





යේ ... ලිබඳව පුහුණුව ලබාදීම.

- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 18 දෙනෙකු සඳහා උඩමුදුන විහාරස්ථානයේදී විසිතුරු මල් පත්‍ර වගා පුහුණු වැඩසටහන පැවැත්වීම.

- හාරිස්පත්තුව ප්‍රදේශීය ලේකම් කාර්යාලයේදී විසිතුරු පත්‍ර මල් වගාව පිළිබඳව පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේදී ප්‍රතිලාභීන් **30** දෙනෙකු සඳහා මී මැසි පාලන පුහුණු වැඩසටහනක් පැවැත්වීම (ඡායාරූප අංක 1).

- පාසල් පාරිසරික වැඩසටහන යටතේ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගත් පාසල්වල කෘෂිවිද්‍යා ගුරුවරුන් **23** ක් සඳහා මී මැසි පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම.

- පාසල් සංවර්ධන වැඩසටහන යටතේ හතරලියද්ද හා ගලගෙදර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල තෝරාගත් පාසල්වල කෘෂිවිද්‍යා ගුරුවරුන් **23** ක් සඳහා මී මැසි පාලනය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම.



**කෘෂිවිද්‍යා ගුරුවරුන්ට ප්‍රායෝගික පුහුණුව ලබාදීම**

- ගම්පොල කුඩා ව්‍යවසායකත්ව සංවර්ධන ආයතනයේ දී ආයතනයේ ජීවනෝපාය වැඩසටහන් හා සම්බන්ධ නිලධාරින්ට බිම්මල් වගාව පිළිබඳව ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම.

- ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ප්‍රතිලාභීන් සඳහා කාර්මික පුහුණු ක්ෂේත්‍රය සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

# ක්‍රියාකාරකම්

❖ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල රිලා උවදුරු අවම කිරීම සඳහා රිලවුන් ඇල්ලීමට රිලා කූඩු ලබාදීම.

❖ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වසම් 22 ක ප්‍රතිලාභීන් 77 දෙනෙකු සඳහා කහ බීජ කිලෝ ග්‍රෑම් 665 ක් සහ ඉගුරු බීජ කිලෝ ග්‍රෑම් 1136 ක් බෙදා දෙන ලදී (ඡායාරූප අංක 1 හා 2).





(1) (2)

❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 732 දෙනෙකු සඳහා කහ සහ ඉගුරු කිලෝ ග්‍රෑම් 5311 ක් බෙදාදීමේ වැඩසටහන පැවැත්වීම.

❖ ගලගෙදර ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී ප්‍රතිලාභීන් 145 දෙනෙකු සඳහා කහ කිලෝ ග්‍රෑම් 960 ක් සහ ඉගුරු ග්‍රෑම් 1975 බෙදා දීම.

❖ පූජාපිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේදී ප්‍රතිලාභීන් 490 දෙනෙකු සඳහා කහ සහ ඉගුරු කිලෝ ග්‍රෑම් 1470 ක් බෙදාදීම.

❖ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 31 දෙනෙකු සඳහා මී මැසි පාලනයට අවශ්‍ය යෙදවුම් හා උපකරණ ලබා දීම (ඡායාරූප අංක 1 හා 2).






(1) (2)

- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 140 දෙනෙකු සඳහා කහ සහ ඉගුරු බීජ බෙදා දීම

- හාරිස්පත්තුව ප්‍රතිලාභීන් 30 දෙනෙකු සඳහා මී මැසි පෙට්ටි හා ජනපද බෙදාදීමේ වැඩසටහන පැවැත්වීම.

- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී රූපලාවන්‍ය උපකරණ බෙදා දීමේ වැඩසටහනක් පැවැත්වීම.

- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 29 දෙනෙකු සඳහා මීමැසි පෙට්ටි සහ ජනපද බෙදාදීම.

- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 100 දෙනෙකු සඳහා බෙහෙත් පෙති කවර නිෂ්පාදනය සඳහා යෙදවුම් ලබාදීම

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 85 දෙනෙකු සඳහා මී මැසි පෙට්ටි 141 ක් හා ජනපද 85 ක් බෙදා දීමට කටයුතු කිරීම.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පූජාපිටිය මැදගොඩ විදාතා මධ්‍යස්ථානයේදී කේශාලංකරණය පිළිබඳ ප්‍රතිලාභීන් 23 දෙනෙකු සඳහා කරණවැම් පුහුණුව හා භාණ්ඩ ලබා දීමට කටයුතු කිරීම.
- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රතිලාභීන් 31 දෙනෙකු සඳහා සාදික්කා පැළ 300 ක් බෙදා දීම.

- දිවිනැගුම ජාතික සංවර්ධන ව්‍යාපාරයේ දෙවෙනි අදියරේ සමාරම්භක අවස්ථාවට සමගාමීව එළවළු, පළතුරු සහ ඖෂධ පැළවලින් සමන්විත පැළ අළෙවි මධ්‍යස්ථානයක් පේරාදෙණිය රාජකීය උද්භිද උද්‍යානය තුළ විවෘත කිරීමට පියවර ගනු ලැබීය. මෙමගින් ප්‍රජාවට රෝපණ ද්‍රව්‍ය පහසුවෙන් ලබා ගැනීමට හැකිවීම මෙන්ම අධිකාරී බල ප්‍රදේශයෙහි පැළතවාන්කරුවන්ට සිය නිෂ්පාදන අළෙවි කර ගැනීමට පහසුකම් සැළසී ඇත.




**පේරාදෙණිය උද්භිද උද්‍යානය තුළ පවත්වාගෙන යනු ලබන - දිවිනැගුම පැළ අළෙවිසල**

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වප් මගුල් උත්සවය වෙනුවෙන් ගොවීන් 50 දෙනෙකු සඳහා උදලු තල 50 ක් ලබා දීමට කටයුතු කරන ලදි.

- අකුරණ ප්‍රාදේශීය සභාවේදී ග්‍රාම නිලධාරී වසම් 03 ක ( දිප්පිටිය, මාවතුපොළ, දෙල්ගස්ගොඩ) ප්‍රතිලාභීන් 08 දෙනෙකු සඳහා ඇම්බුන් කෙසෙල් පැළ 10 බැගින් බෙදා දීම.

# නිමැවුම්

## ඉඟුරු වගාව




පත්මා කුමාරි නන්දතිලක මහත්මියගේ ඉඟුරු වගා ව්‍යාපෘතිය (අංක 69/5, වටගොඩ, හාරිස්පත්තුව)




නීතා දමයන්ති තැන්නගේ මහත්මියගේ ඉඟුරු වගා ව්‍යාපෘතිය
(අංක 38/ඒ, වටගොඩ,හාරිස්පත්තුව)




එස්. රුක්මනී ජයසේන මහත්මියගේ ඉඟුරු වගා ව්‍යාපෘතිය (අංක 99/3, වී මෝල, හේනේගම)





සුසන්තා රාජපක්ෂ මහත්මියගේ ඉඟුරු වගා ව්‍යාපෘතිය (අංක 23/3, වටගොඩ, හාරිස්පත්තුව)

**කහ වගාව**



පත්මා කුමාරි තන්දතිලක මහත්මියගේ කහ වගා ව්‍යාපෘතිය
(අංක 69/5, වටගොඩ, හාරිස්පත්තුව)





නිතා දමයන්ති තැන්නගේ මහත්මියගේ කහ වගා ව්‍යාපෘතිය
(අංක 38/ඒ, වටගොඩ, හාරිස්පත්තුව)



සුසන්තා රාජපක්ෂ මහත්මියගේ කහ වගා ව්‍යාපෘතිය
(අංක 23/3, වටගොඩ, හාරිස්පත්තුව)

## මීමැසි පාලනය



ඩබ්.එම්. අජන්තා විජේරත්න මහත්මියගෙ මීමැසි පාලන ව්‍යාපෘතිය
(දීප්ති, දිද්දෙණිය පූජාපිටිය)



ආර්.පී.පී. තමරා රාජපක්ෂ මහත්මියගේ මීමැසි පාලන ව්‍යාපෘතිය
(අංක 30, වැලිගල්ල, පූජාපිටිය)



බී.එම්. සමරසිංහ මහත්මියගේ මීමැසි පාලන ව්‍යාපෘතිය
(සේන්ද්‍රාවත්ත, යග්ගල, හතරලියද්ද)

# අධ්‍යාත්මික සංවර්ධනය

<u>**දැනුවත්කිරීමේ වැඩසටහන්**</u>

- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් 44 ක ගුරුවරුන් 80 දෙනෙකු සඳහා පාලි භාෂාව පිළිබඳ දැනුවත් කිරිමේ පුහුණු වැඩසටහන.
- ❖ ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගාලියාව විහාරස්ථානයේදී ළමා මිතුරු තක්සලාව ආකල්ප සංවර්ධන වැඩසටහන පැවැත්වීම.
- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් සඳහා ආකල්ප සංවර්ධනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.
- ❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසැල් ගුරුවරුන් 120 දෙනෙකු සඳහා ආකල්ප ප්‍රවර්ධන වැඩසටහනක් පැවැත්වීම.



- ❖ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් ගුරුවරුන් 104 දෙනෙකු සඳහා දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

- ❖ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ විවාහ අපේක්ෂිත තරුණ තරුණියන් සඳහා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.

- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසැල් ගුරු පුහුණු වැඩසටහන පැවැත්වීම.

- ❖ හතරලියද්ද  ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දහම් පාසල් 31 අතුරින් දහම් පාසල් ගුරුවරුන් 100 දෙනෙකු සඳහා දහම් පාසල් ගුරු ආකල්ප සංවර්ධන වැඩසටහන පැවැත්වීම.



දහම්පාසල් ගුරුවරුන් සඳහා පැවැත්වූ ආකල්ප සංවර්ධන වැඩසටහන

- ❖ හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පෙර පාසල් ගුරුවරුන් 30 දෙනෙක් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම.
- ❖ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල සනිපාරක්ෂක වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිලාභීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

## <u>ක්‍රියාකාරකම්</u>

- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රඹුක්වෙල ශ්‍රී හේමානන්ද දහම් පාසල සඳහා වයිට් බෝඩ් 04 ක් සහ ප්ලාස්ටික් පුටු 12 ක් පරිත්‍යාග කිරීම
- ❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බාන්වැල්ගොල්ල, යටිහලගල, බෝගහකන්ද යන ග්‍රාම නිලධාරි වසම්වල පිහිටි දහම් පාසල් සඳහා උපකරණ බෙදා දීම.
- ❖ පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සියපත්ගම සිරි සුමේධ දහම් පාසල වෙත උපකරණ ලබාදීම.
- ❖ අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මස්ජිද් හාෆිල් ඉබ්නු හජීර් දහම් පාසල වෙත උපකරණ බෙදා දීම.

❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අත්තරගම ශ්‍රී ධර්මපාලි දහම් පාසැල, සාරිපුත්ත දහම් පාසල සහ රුවන්පුරය බෝධිරුක්ඛාරාම දහම් පාසැල සඳහා උපකරණ බෙදාදීම.





❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිකන්ද ශ්‍රී සුධර්මාරාම දහම් පාසල සඳහා වැසිකිලි පහසුකම් ලබාදීම.

❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ධම්මාලෝක දහම් පාසල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය.

❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ධර්මපාල දහම් පාසල නමින් නව දහම් පාසලක් ආරම්භ කිරීම.





අලුතින් ආරම්භ කළ ධර්මපාල දහම්පාසල

❖ හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බෝතොට පුස්තකාලය සඳහා පොත් ලබාදීම.

❖ හාරිස්පත්තුව සංස්කෘතික මධ්‍යස්ථානයේ සමස්ත ලංකා ජයග්‍රහණ ලැබූ සිසුන් සඳහා පොත් ලබාදීම.

❖ හාරිස්පත්තුව සංස්කෘතික මධ්‍යස්ථානය මුල්කර ගනිමින් සොකරි ශාන්ති කර්මයක් පැවැත්වීම.

❖ පූජාපිටිය ඤානාලෝක පෙර පාසැලේ වහලය ඉදිකිරීම.

❖ අකුරණ කොණකලගල ශ්‍රී විජිත මහා විහාරයට ප්ලාස්ටික් පුටු 50 ක් ලබාදීම.

❖ පාසැල් පාරිසරික වැඩසටහන යටතේ පාසැල් ගෙවතු සඳහා රෝපණ ද්‍රව්‍ය බෙදාදීම.

i. හතරලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 8

ii. ගලගෙදර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 10

iii. හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 14

iv. පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 14

v. අකුරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 5





❖ පාසැල් පාරිසරික වැඩසටහන යටතේ පාසැල් ගෙවතු සඳහා මී මැසි පෙට්ටි හා ජනපද බෙදාදීම.

i. හතරලියද්ද ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 7

ii. ගලගෙදර ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 9

iii. හාරිස්පත්තුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 12

iv. පූජාපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 12

v. අකුරණ ජාතික ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය, පාසැල් සංඛ්‍යාව 5





- ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කෝපිවත්ත හා ගිරිහාගම විහාරස්ථානවලදී බෝධිපූජාමය වැඩසටහනක් පැවැත්වීම.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආගමික සිද්ධස්ථාන 75ක්, ප්‍රජාමූල සංවිධාන 20 ක්, මහජන පුස්තකාල 4 ක් සඳහා ඖෂධ පැළ 3306 ක් බෙදා දීමට කටයුතු කිරීම.

- අතිගරු ජනාධිපතිතුමන්ගේ දෙවන පදවි ප්‍රාප්තිය වෙනුවෙන් "දැයට සෙවන" රුක් රෝපණ වැඩසටහන් පැවැත්වීම.




- ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආගමික සිද්ධස්ථාන 05 ක ඔසු උයන් පිහිටුවීම සඳහා ඖෂධ වර්ග 34 කින් ඔසු පැළ 2964 ක්, අදාළ ආගමික සිද්ධස්ථාන වෙත ලබා දීමට කටයුතු කරන ලදි.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රජා මූල සංවිධාන 20 ක් සඳහා මැංගුස්, අඹ, රඹුටන්, දූරියන්, පේර, දෙළුම් අලිපේර, පැණි දොඩම්, ඇඹිබන්, තැඹිලි, උගුරැස්ස, මැලේසියන් ජම්බු යන සෑම වර්ගයකින්ම පැළ 03 බැගින් පළතුරු පැළ 720 ක් බෙදාදීමේ වැඩසටහනක් පැවැත්වීම.

- ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන යටතේ අකුරණ ප්‍රාදේශීය සභාවේදී අල්මාරි 27 ක් සහ වයිට් බෝඩ් 36 ක් වශයෙන් දහම් පාසල් උපකරණ ප්‍රාදේශීය සභාව වෙත ලබා දීම.
- ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන යටතේ හාරිස්පත්තුව ප්‍රාදේශීය සභාවේදී අඩි 3×2 ප්‍රමාණයේ වයිට් බෝඩ් 181 ක් සහ ලිපිගොනු අල්මාරි 33 ක් වශයෙන් දහම් පාසල් උපකරණ ප්‍රාදේශීය සභාව වෙත ලබා දීම.

- ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන යටතේ හතරලියද්ද හා ගලගෙදර යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල් දහම් පාසල් , පෙර පාසල් සහ මාතෘ සායන සඳහා උපකරණ ප්‍රාදේශීය සභාව වෙත භාර දීම.

## <u>උඩරට නවෝදය ගුවන්විදුලි වැඩසටහන</u>

අධිකාරියෙහි නම් කළ බල ප්‍රදේශයෙහි ගම්මානවල ප්‍රජාවගේ හැකියාවන් ඉහළ නංවමින් ඔවුන්ට සිය දක්ෂතා එළි දැක්වීම උදෙසා ගුවන් විදුලි සංස්ථාවෙහි කඳුරට සේවය හා එක්ව උඩරට නවෝදය ගුවන් විදුලි වැඩසටහන සෑම මසකම එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක ක්‍රියාත්මක කරන ලදී.

❖ 2011.03.31 කඳුරට F.M. සේවය සමග **උඩරට නවෝදය** ප්‍රචාරාත්මක ගුවන් විදුලි වැඩසටහන පටිගත කිරීම - හතරලියද්ද .






❖ 2011.04.29 වන කඳුරට F.M ගුවන් විදුලි සේවය සමග උඩරට නවෝදය ප්‍රචාරාත්මක වැඩසටහන පටිගත කිරීම - ගලගෙදර





❖ 011.05.27 - හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උඩරට නවෝදය ගුවන් විදුලි වැඩසටහන පැවැත්වීම.

❖ 2011.06.24 - පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රඹුක්වෙල කණිෂ්ඨ විද්‍යාලයේදී උඩරට නවෝදය ගුවන් විදුලි වැඩසටහන පැවැත්වීම.

❖ 2011.07.28 - අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දුණුවිල රතනපාල විද්‍යාලයේදී උඩරට නවෝදය ගුවන්විදුලි වැඩසටහන පැවැත්වීම.

- 2011.09.23 - ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගලබාව මහා විද්‍යාලයේදී උඩරට නවෝදය ගුවන්විදුලි වැඩසටහන පැවැත්වීම.

- 2011.10.27 - හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නුගවෙල පිරිමි විද්‍යාලයේදී උඩරට නවෝදය ගුවන් විදුලි වැඩසටහන පටිගත කිරීම.

- 2011.11.24 - පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හේනේගම සංඝානන්ද පිරිවෙනේදී උඩරට නවෝදය මාසික ගුවන් විදුලි වැඩසටහන පටිගත කිරීම.

- 2011.12.29 - අකුරණ කොණකලගල විහාරස්ථානයේදී ,උඩරට නවෝදය මාසික ගුවන් විදුලි වැඩසටහන, පටිගත කිරීම.

<u>රූපවාහිනී වැඩසටහන්</u>

- සභාපතිතුමා, අධිකාරියේ කළමනාකරණ මණ්ඩල සාමාජික හා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (පාලන) සීතා සේනාරත්න මහත්මිය සහ අධිකාරියේ සංවර්ධන අධ්‍යක්ෂවරයාගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සංවර්ධන වැඩසටහන් පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2011.07.27 දින පෙ.ව 11.30 සිට 12.00 දක්වා ස්වාධීන රූපවාහිනී නාලිකාවේ විකාශනය කරන ලදී.

- සභාපතිතුමා, කළමනාකරණ මණ්ඩල සාමාජික වෝල්ටර් රණසිංහ මැතිතුමා සහ අධ්‍යක්ෂ (සංවර්ධන)ගේ සහභාගීත්වයෙන් ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සංවර්ධන වැඩසටහන් පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2011.08.15 දින පස්වරු 6.00 සිට 6.30 දක්වා ජාතික රූපවාහිනී නාලිකාවේ විකාශනය කරන ලදී.

<u>ජාත්‍යන්තර දින සැමරුම් වැඩසටහන්</u>

- ජාත්‍යන්තර කාන්තා දිනය නිමිත්තෙන් හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය හා අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල කාන්තා දින සමරු උත්සවය පැවැත්වීම.

- ලෝක දුම්වැටි හා දුම්කොළ විරෝධී දිනය වෙනුවෙන් හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවනාගාරයේදී දුම්වැටි භාවිතයෙහි ආදීනව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

- හතරලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හතරලියද්ද ප්‍රාථමික විද්‍යාල ශ්‍රවනාගාරයේදී වැඩිහිටියන් 200 දෙනෙකු සහ ළමුන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් විශ්ව ළමා දිනය හා වැඩිහිටි දින සැමරුම් උත්සවය පැවැත්වීම.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමුන් 110 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ලෝක ළමා දින සැමරුම් උත්සවය පැවැත්වීම.

- අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් ළමුන් 1003 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ලෝක ළමා දින සැමරුම් උත්සවය පැවැත්වීම.

- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ළමා සමාජ 40 ක් නියෝජනය කරමින් ළමුන් 110 දෙනෙකුගේ සහභාගිත්වයෙන් ලෝක ළමා දින සැමරුම් උත්සවය පැවැත්වීම .





- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පෙර පාසල් 36 ක ළමුන් 1155 දෙනෙකු සහභාගිකරවා ගනිමින් ලෝක ළමා දින සැමරුම් උත්සවය පැවැත්වීම.

- ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ජාත්‍යන්තර ළමා හා වැඩිහිටි දිනයට සමගාමීව වීදි නාට්‍යයක් ප්‍රදර්ශනය කිරීම.

- ගලගෙදර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ ජාත්‍යන්තර වැඩිහිටි දිනයට සමාන්තරව වැඩිහිටි සමිති සාමාජිකයන් 400 දෙනෙකු පමණ සහභාගිත්වයෙන් වැඩිහිටි දින සැමරුම් උළෙල පවත්වන ලදී.

## රාජ්‍ය ආයතන හා ස්වේච්ඡා සංවිධාන ඒකාබද්ධව ක්‍රියාත්මක කළ වැඩසටහන්.

- කාන්තා පිහිට ආයතනය සමග ඒකාබද්ධව මනෝ වෛද්‍ය දේශන, කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන්, ළමා හා පෝෂණ වැඩසටහන්, කාන්තාවනට විශේෂ වූ නොයෙකුත් ගැටලු සාකච්ඡා කිරීම, විවාහපේක්ෂිත කරුණ තරුණියන් වෙනුවෙන් ආදී වශයෙන් වැඩසටහන් රැසක් බල ප්‍රදේශය තුළ ක්‍රියාත්මක කරන ලදී.
- පළාත් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා ප්‍රමුඛ කොට්ඨාශ මට්ටමේ ග්‍රාම සංවර්ධන නිලධාරින් සමග සාකච්ඡාවක් පවත්වා බල ප්‍රදේශයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්හි ග්‍රාම සංවර්ධන නිලධාරින් හා ග්‍රාම සංවර්ධන සමිති හා සම්බන්ධ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.

- මධ්‍යම පළාත් සංස්කෘතික දෙපාර්තමේන්තුවේ නිලධාරින් සමග සාකච්ඡාවක් පැවැත්වීම

- ආගමික සිද්ධස්ථාන ආශ්‍රිත ඔසු උයන් සංවර්ධනය පිළිබඳව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කොමසාරිස් සහ ආගමික නායකයින් සමඟ සාකච්ජාවක් පැවැත්වීම.





- මධ්‍යම පළාත් පරිසර අධිකාරියේ නිලධාරින් සමග සාකච්ජාවක් පැවැත්වීම.

- ජීවනෝපාය සහ ආධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී සමාජ සේවා දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගැනීම සඳහා මධ්‍යම පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යක්ෂ සහ ප්‍රාදේශීය සමාජ සේවා නිලධාරින් සමඟ සාකච්ජා කිරීම.

- උඩරට ආවේනික සංස්කෘතික අංග හඳුනාගැනීම, ආරක්ෂා කිරීම සහ කලාකරුවන් දිරිගැන්වීම සඳහා අධිකාරියෙහි නම් කළ බල ප්‍රදේශයෙහි කලායතනාධිපතිවරුන් සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි සංස්කෘතික නිලධාරින් සමඟ සාකච්ජා කිරීම.

- අධිකාරි බල ප්‍රදේශයෙහි තරුණ, තරුණියන්ගේ විවිධ දක්ෂතා හඳුනාගනිමින් එම දක්ෂතා වැඩිදියුණු කරගැනීම සඳහා ඔවුන් දිරිගැන්වීම පිණිස මධ්‍යම පළාත් තරුණ සේවා සභාවේ සහකාර අධ්‍යක්ෂ සහ හතරලියද්ද, ගලගෙදර, හාරිස්පත්තුව, පූජාපිටිය සහ අකුරණ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 හි තරුණ සේවා නිලධාරින් සමඟ මූලික සාකච්චාවක් පැවැත්වීම.







**අධිකාරිය මගින් මතට තිත ව්‍යාපෘතිය යටතේ කරන ලද ප්‍රචාරාත්මක වැඩසටහන්**

- අධිකාරි බල ප්‍රදේශය තුළ මත් නිවාරණ වැඩසටහන් පැවැත්වීම සහ ජනතාව මතින් හා දුම්වැටියෙන් මුදවාගැනීම සඳහා අධිකාරියේ නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහන මත්පැන් හා මත්ද්‍රව්‍ය තොරතුරු මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව පැවැත්වීම.

## සෞඛ්‍ය සේවා වැඩසටහන්

- නම් කරන ලද බල ප්‍රදේශයෙහි මූලික සෞඛ්‍ය අවශ්‍යතාවයක් වන වැසිකිළි පහසුකම් ලබාදීමට කටයුතු කරන ලදි. මෙහිදී තෝරාගත් වැසිකිළි පහසුකම් නොමැති පවුල් 413 ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය සිමෙන්ති බ්ලොක් ගල්, සිමෙන්ති රුළි තහඩු හා වැසිකිළි පෝච්චි ලබාදීමට කටයුතු කරන ලදි. මෙමගින් පවුල තුළ යහපත් සෞඛ්‍ය තත්ත්වයක් ගොඩනැගීම හා යහපත් සෞඛ්‍ය පුරුදු පුහුණු කිරීම, බෝවන රෝග අවම කිරීම අපේක්ෂා කරනු ලැබේ.
- හතරලියද්ද සෞඛ්‍ය වෛද්‍ය මධ්‍යස්ථානයේදී ගැබිණි මව්වරුන් සඳහා මාසිකව මාපිය පාරමිතා වැඩසටහන පැවැත්වීම.
- හතරලියද්ද මාතෘ සායන මධ්‍යස්ථානය දෙකක් අලුත්වැඩියා කිරීම.
- ගලගෙදර ගලබාව මාතෘ සායනය අලුත්වැඩියාව
- අකුරණ ගර්භනී කාන්තාවන් සඳහා වූ ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙහි සුවනාරි සෞඛ්‍ය සායන පැවැත්වීම.
- පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හේමානන්ද දහම් පාසල සමග ඒකාබද්ධව ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම (ඡායාරූප අංක 1 හා 2



1



2

# සුළු වාරිමාර්ග හා කෘෂි මාර්ග සංවර්ධන ව්‍යාපෘති

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ව්‍යාපෘතිය | අනුමත මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | අනුඥාත ව්‍යාපෘති සංඛ්‍යාව | ගිවිසුම් ගත මුළු ව්‍යාපෘති සංඛ්‍යාව | 2012.12.31 දිනයට වැය කළ මුදල (රු.මි) | අවිච්ඡේද ව්‍යාපෘති සංඛ්‍යාව | බැඳීම්ගත ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| 01 | හතරලියද්ද | සුළු වාරි මාර්ග | 44 | 44 | 43 | 7.06 | 4 | 6 |
| | | කෘෂි මාර්ග | 83 | 75 | 64 | 13.57 | 14 | 11 |
| 02 | ගලගෙදර | සුළු වාරි මාර්ග | 64 | 46 | 44 | 7.74 | 8 | 12 |
| | | කෘෂි මාර්ග | 130 | 112 | 105 | 10.01 | 49 | 23 |
| 03 | හාරිස්පත්තුව | සුළු වාරි මාර්ග | 113 | 101 | 101 | 24.88 | 22 | 8 |
| | | කෘෂි මාර්ග | 54 | 30 | 29 | 5.32 | 5 | - |
| 04 | පූජාපිටිය | සුළු වාරි මාර්ග | 89 | 79 | 73 | 12.73 | 31 | 2 |
| | | කෘෂි මාර්ග | 44 | 42 | 40 | 5.54 | 7 | 8 |
| 05 | අකුරණ | සුළු වාරි මාර්ග | 30 | 30 | 30 | 5.61 | 9 | 2 |
| | | කෘෂි මාර්ග | 26 | 23 | 23 | 1.67 | 11 | 4 |
| **එකතුව** | | | **677** | **582** | **552** | **94.13** | **160** | **76** |

# පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘති

අධිකාරියට අයත් බල ප්‍රදේශයෙහි පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවය මත 2011.09.19 වන දින සහකාර අධ්‍යක්ෂවරයෙකු බඳවා ගනිමින් පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදී. ඒ අනුව පහත වැඩසටහන් ක්‍රියාවට නැංවීමට කටයුතු කරන ලදී.

- කිරිගව පාලන ව්‍යාපෘතිය
- එළු පාලන ව්‍යාපෘතිය
- කුකුළු පාලන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘති ආරම්භ කිරීමේ මූලික පියවරයන් වශයෙන් සත්ව පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ මූලික රැස්වීම් එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වා ස්ථාන පරීක්ෂාවකින් ද පසුව ප්‍රතිලාභින් තෝරා ගන්නා ලදී.

| අනු අංකය | ප්‍රා. ලේ. කො. | කිරිගව පාලන | | එළු පාලන | | කුකුළු පාලන | |
|---|---|---|---|---|---|---|---|
| | | ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් ගණන | තෝරාගත් ප්‍රතිලාභින් | ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් ගණන | තෝරාගත් ප්‍රතිලාභින් | ඉල්ලුම් කරන ලද ප්‍රතිලාභීන් ගණන | තෝරාගත් ප්‍රතිලාභින් |
| 01 | හතරලියද්ද | 37 | 13 | 48 | 11 | 48 | 32 |
| 02 | ගලගෙදර | 21 | 09 | 21 | 13 | 98 | 74 |
| 03 | හාරිස්පත්තුව | 26 | 08 | 37 | 10 | 107 | 38 |
| 04 | පූජාපිටිය | 20 | 12 | 24 | 08 | 38 | 27 |
| 05 | අකුරණ | 29 | 11 | 40 | 13 | 164 | 81 |

ප්‍රතිලාභීන් තෝරා ගැනීමෙන් පසු මෙම සියලු ව්‍යාපෘති සඳහා පුහුණු වැඩසටහන් පවත්වමින් ප්‍රතිලාභීන් දැනුවත් කිරීම සිදුකරන ලදී.





කිරිගව පාලන ව්‍යාපෘතිය සඳහා පවත් වන ලද පුහුණු වැඩසටහන




එළු පාලන ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන

09. කුකුළු පාලන ව්‍යාපෘතිය යටතේ අදාල ප්‍රතිලාභීන් සඳහා පුහුණු වැඩසටහන් 04ක් පැවැත්වීම.




කුකුළු පාලන ව්‍යාපෘතිය යටතේ පවත්වන ලද පුහුණු වැඩසටහන

මේ අනුව එක් එක් ව්‍යාපෘතීන් සඳහා පුහුණු වැඩසටහන් 17 ක් පැවැත්වීමට කටයුතු කර ඔවුන්ගේ අවශ්‍යතාවයන් අනුව පහත පරිදි සතුන් හා ද්‍රව්‍යමය ආධාර ලබා දීමට අවශ්‍ය පියවර ගනු ලැබීය.

| අනු අංකය | ද්‍රව්‍යමය ආධාර/සතුන් | ප්‍රමාණය |
|---|---|---|
| 01 | සැලසුම් කළ ව්‍යාපෘතිය යටතේ ගව ගාල් | 51 |
| 02 | අමතර ගව ගාල් | 07 |
| 03 | කිරි ගවයින් | 52 |
| 04 | එළුවන් | 165 |
| 05 | කුකුළු පැටවු | 3024 |

ගවගාල් ලබාදීමේ දී 51 දෙනෙකු සඳහා ගවගාල් ලබාදීමට තෝරා ගනු ලැබුව ද හාරිස්පත්තුව පූජාපිටිය හා අකුරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ප්‍රතිලාභීන්ගෙන් ලැබුණු විශේෂ ඉල්ලීම් සලකා බැලීමෙන් අනතුරුව අමතර ප්‍රතිලාභීන් 07 දෙනෙකු සඳහා ගව ගාල් ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර ලබා දීමට කටයුතු කරන ලදී.





ප්‍රතිලාභීන් සඳහා ද්‍රව්‍යමය ආධාර ලබාදීම

ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් බෝපත් තලාව මැණික් පාලම ගොවිපලෙන් ප්‍රතිලාභීන්ට අවශ්‍ය කිරි ගවයින් හා එළුවන් තෝරා ගැනීම සිදුකරන ලදී.





ගවයින් හා එළුවන් තේරීම - ජාතික පශු සම්පත් මණ්ඩලයට අයත් බෝපත් තලාව මැණික් පාලම ගොවිපල

ප්‍රතිලාභීන් වෙත බෙදා දීම සඳහා ශ්‍රී ලංකා හදබිම අධිකාරිය මගින් මසක් වයසැති කුකුළු පැටවුන් ලබා ගැනීමට කටයුතු කරන ලදී.





පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දී ප්‍රතිලාභීන් වෙත කුකුළු පැටවුන් බෙදා දීම.

මේ අනුව මාස 03 ක වැනි ඉතා කෙටි කාලයක් තුළ ව්‍යාපෘති හඳුනා ගනිමින්, සැලසුම් කරමින් සාර්ථකව ක්‍රියාත්මක කිරීමට 2011 වසරේ දී හැකිවිය.

# ඉදිකිරීම් අංශය

ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු හා තාක්ෂණික ලියකියවිලි පිළියෙල කිරීම හා තාක්ෂණික තත්ව පාලනය, ප්‍රමිතීන් අධීක්ෂණය සිදු කිරීම, ටෙන්ඩර් පරිපාටියෙහි තාක්ෂණ ඇගයීම, වැඩබිම් පරීක්ෂා කිරීම, අදාළ බිල්පත් පරීක්ෂා කිරීම සහ නිර්දේශ කිරීම ඉංජිනේරු අංශයට අදාළ මූලික වගකීම් වේ.

## 2011 වර්ෂය - ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

2011 වසරේ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ දේශීය කෘෂිකර්මාන්තය නැංවීමට අදාළව වී අස්වැන්න ඉහළ නැංවීම උදෙසා පුරන් කුඹුරු අස්වැද්දීමට අවශ්‍ය වාරි ජලය සපයමින් සුළු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති **340** ක් සහ ග්‍රාමීය කෘෂි බෝග නගර කරා රැගෙන යාමට පහසුකරවමින් කෘෂි මාර්ග **337** ක් ඉදිකිරීම සඳහා අවශ්‍ය ඇස්තමේන්තු සකස් කිරීම, බිල්පත් හා ප්‍රමිතීන් පරීක්ෂා කර ගෙවීම් නිර්දේශ කිරීම සිදුකරන ලදී.



හාරිස්පත්තුව මාලගම්මන දෙපා වේල්ල



ගලගෙදර අක්කරවත්ත උඩපාර කෘෂි මාර්ගය

## නොනිමි ව්‍යාපෘති

2006, 2007 හා 2008 යන වසරවල දී ආරම්භ කරන නමුත් අවසන් නොකළ ව්‍යාපෘති ප්‍රජාවගේ බලවත් ඉල්ලීම පරිදි නැවත ආරම්භ කිරීමට පියවර ගන්නා ලදී. ඒ අනුව වසර කිහිපයක් අතරමග ඉදිකිරීම් නවතා තිබූ ව්‍යාපෘති රැසක ප්‍රතිලාභ ලබා ගැනීමට ප්‍රජාවට හැකිවිය.

**.1. අකුරණ උඩවැලිකැටිය අමුණේවෙල පාලම ඉදිකිරීම.**

2008 වර්ෂයේ දී ඉදිකිරීම් ආරම්භ කර වැඩ අවසන් කිරීමට නොහැකි වූ ව්‍යාපෘතියක් වන මෙම ව්‍යාපෘතිය නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේදී නැවත ඉදිකිරීම් ආරම්භ කර, සියලු ඉදිකිරීම් අවසන් කර ජනතා අයිතියට පත්කර ඇත. ප්‍රතිලාභීන් 1680 ක් පමණ වන මෙම ව්‍යාපෘතියේ ඉදිකිරම් සඳහා වැය වූ මුදල රුපියල් මිලියන 1.07 කි. ප්‍රදේශයේ ජීවත්වන බහුතර මුස්ලිම්

ජනතාවගේ සහ පාසැල් දරු දැරියන්ගේ දෛනික ගමනාගමන කටයුතු සඳහා විශාල අඩුපාඩුවක්ව පැවති මෙම පාලම ඉදිකිරීම හේතුවෙන් විශාල සහනයක් ඔවුනට සැලසී ඇත.



**අකුරණ උඩවැලිකැටිය අමුණේවෙල පාලම**

**2. අකුරණ උඩවැලිකැටිය පාලමේ ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම**

උඩවැලිකැටිය අමුනේවෙල පාලම ඉදිකිරීමත් සමගම එම පාලමේ පිවිසුම් මාර්ගය ද ඉදිකිරීම අත්‍යවශ්‍ය වූ හෙයින් රුපියල් මිලියන 1.02 ක් වැය කරමින් එහි ප්‍රවේශ මාර්ගයේ ද වැඩ අවසන් කර ජනතාවගේ ගමනාගමන පහසුකම් වැඩිදියුණු කරන ලදී.

**3 මහනුවර දංගොල්ල මවුන්ට් ප්ලසන්ට් වත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීම**

රු.මි. 0.88 ක් වැය කර ඉදිකරන ලද මෙම මාර්ගයෙන් ප්‍රදේශයේ 465 ක් පමණ වූ ප්‍රතිලාභී ජනතාවගේ දෛනික ගමනාගමන කටයුතුවලට මෙන්ම කෘෂි කාර්මික කටයුතුවලට ද පාසැල් දරු දැරියන්ගේ දෛනික ගමනාගමන කටයුතු සඳහා ද විශාල පහසුවක් සැලසී ඇත.





**4 වැලිමඩ බෝගහකුඹුර - තැන්න කුඹුර කෘෂි මාර්ගය කොන්ක්‍රීට් කිරීම**

2007, වර්ෂයේ දී ඉදිකිරීම් ආරම්භ කර එහෙත් වැඩ අවසන් කර නොතිබූ මෙකී මාර්ගයේ ඉදිකිරීම් ද නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේ දී ආරම්භ කර, වැඩ නිමකිරීමෙන් අනතුරුව ජනතා අයිතියට පත්කර ඇත. කෘෂි කාර්මික ජනතාවකගේ දෛනික ප්‍රවාහන කටයුතු සඳහා ඉමහත් පිටුවහලක් වන මෙම මාර්ගය ඉදිකිරීම මගින් එකී ජනතාවට සමාජයීය සහ ආර්ථික වශයෙන් විශාල සහනයක් වී ඇති බව පැහැදිලිය. ව්‍යාපෘතිය සඳහා වැය කල මුළු මුදල රු. මිලියන 2.99 කි.




**වැලිමඩ බෝගහකුඹුර - තැන්න කුඹුර කෘෂි මාර්ගය**

**5 අකුරණ සිත්තෝඩය පාලම හා පාර කොන්ක්‍රීට් කිරීම**

තමම ව්‍යාපෘතිය ද 2008 වර්ෂයේ දී ගම නැගුම වැඩසටහන යටතේ ඉදිකිරීම් ආරම්භ කර වැඩ අවසන් නොකළ ව්‍යාපෘතියකි. ඒ අනුව නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේ දී නැවත ඉදිකිරීම් ආරම්භ කර ඇත. ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 3.20.ක් වන මෙහි 2011 වසර අවසන් වන විට ඉදිකිරීම් කටයුතු 35% ක් පමණ අවසන් කිරීමට හැකිවිය. ප්‍රතිලාභීන් 2475කට පමණ සෙත සැලසෙන මෙහි ඉතිරි ඉදිකිරීම් කටයුතු ඉතා කඩිනමින් අවසන් කර ජනතාව වෙත පවරාදීමට නියමිතය.

**6 හතරලියද්ද නාරංගස්පිටිය වීවල පාලම ඉදිකිරීම**

නාරන්ගස්පිටිය, අක්කරවත්ත, දෙහිඅත්තේමඩ, වීවල, වෙලගම ආදි අති දුෂ්කර කෘෂි ගම්මාන රැසක් මැදින් ගලායන රඹුක්කන් ඔය හේතුවෙන් මෙම ගම්මාන කාලයක් තිස්සේ හුදකලා වී තිබුණි. මෙම ඔය හරහා පාලමක් ඉදිකරගැනීමේ විශාල උත්සහයක ප්‍රදේශවාසීන් යෙදී තිබුණ ද එම ප්‍රයත්නයන් අසාර්ථක වී ඇත. ඔය හරහා ගමන් කිරීමේ දී අනතුරට පත්වී ඇති පාසැල් දරු දැරියන් මෙන්ම වැඩිහිටියන් ද විශාල පිරිසකි. ජනතාවට ගමනාගමන පහසුකම් සළසාදීම මෙන්ම ප්‍රදේශයේ ආර්ථික, සාමාජික සංවර්ධනය ද අපේක්ෂා කරමින් මෙම ව්‍යාපෘතිය 2009 වසරේ ආරම්භ කළ ද මතු වූ දුෂ්කරතා හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතර මග නැවත්වීමට සිදු වුවත් 2011 වර්ෂයේ දී නැවත ඉදිකිරීම් ආරම්භ කර කරන ලදි. සමස්ත ඇස්තමේන්තු මුදල රු.මිලියන 13.89ක් වන මෙහි මේ වන විට ආයෝජනය කර ඇති මුදල

රුපියල් මිලියන 5.51 කි. 2680 ක් පමණ වූ ප්‍රතිලාභීන්ට පැන නැගුන ගමනාගමන දුෂ්කරතාවයන් නිමා කිරීමේ අරමුණින් වැඩ අවසන් කිරීමට සැළසුම් කළ ද පාලම සඳහා පිවිසුම් මාර්ගය ද ඉදිකිරීමට සිදු වූ හෙයින් එහි වැඩ අවසන් කිරීමට නොහැකි විය. කෙසේ වුවද මේ වන විට ඉදිකිරීම් කටයුතු 60% ක් පමණ අවසන් කර ඇති අතර මෙහි ඉතිරි ඉදිකිරීම් ඉතා කඩිනමින් අවසන් කිරීමට නියමිතව ඇත.





**ඉදිකරමින් පවතින තාරංගස්පිටිය වීවල පාලම**

**7 උඩුනුවර හියරාපිටිය නාගහමුල හොරේකොටේ මාර්ගය සංවර්ධනය කිරීම.**

මෙම ව්‍යාපෘතිය ද 2008 වර්ෂයේ දී ගම නැගුම වැඩසටහන යටතේ ඉදිකිරීම් ආරම්භ කළ ද වැඩ අවසන් නොකළ ව්‍යාපෘතියකි. ඒ අනුව නොනිමි ව්‍යාපෘති ඉදිකිරීම් අවසන් කිරීමේ වැඩසටහන යටතේ 2011 වර්ෂයේ දී නැවත ඉදිකිරීම් ආරම්භ කර වසර අවසන් වන විට ඉදිකිරීම් කටයුතු 60% ක් පමණ අවසන් කිරීමට හැකියාව ලැබී ඇත. ඇස්තමේන්තුගත මුදල රු. මිලියන 3.07.ක් වන මෙහි දැනට ඉතිරි ඉදිකිරීම් කටයුතු ඉතා කඩිනමින් අවසන් කර ජනතාව වෙත පවරාදීමට නියමිත අතර ප්‍රතිලාභීන් 620 ක් පමණ වූ කෘෂිකාර්මික ජනතාවගේ එදිනෙදා ගමනාගමන කටයුතුවලට මෙමගින් පහසුවක් සැලසෙනු ඇත.



**8 කොත්මලේ නව තිස්පනේ බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම.**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හරංගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් 2007 වසරේ ආරම්භ කර අවසන් කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී නැවත ආරම්භ කළ අතර දැනට ඉදිකිරීම් කටයුතු 50% ක් පමණ නිම කර ඇත. ඉතිරි ඉදිකිරීම් කටයුතු 2012 වසරේ ඉතා කඩිනමින් අවසන් කර ජනතාව වෙත පවරාදීමට නියමිතය. මෙහි ඇස්තමේන්තු මුදල රු. මිලියන 0.92කි.




**9 කොත්මලේ මාවෙල ප්‍රජාශාලා ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරීම් නිම කිරීම**

නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාවෙල නැගෙනහිර වසමේ පිහිටි මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් ද නිම කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී නැවත ආරම්භ කළ අතර 2011 වසර අවසන් වන විට ඉදිකිරීම් කටයුතු 60% ට වැඩි ප්‍රමාණයක් අවසන් කර ඇත. ඉතිරි ඉදිකිරීම් කටයුතු ඉතා කඩිනමින් නිම කර ජනතාව වෙත පවරාදීමට නියමිත අතර මෙමගින් ප්‍රතිලාභීන් 950ක් පමණ වූ ප්‍රදේශවාසී ජනතාවට සමිති සමාගම් පැවැත්වීමට, දරුවන් වෙනුවෙන් පෙර පාසල් කටයුතු පවත්වා ගෙන යාමට විශාල පහසුවක් සැලසෙනු ඇත. මෙහි ඇස්තමේන්තු මුදල රු. මිලියන 1.30කි.




**10 කොත්මලේ මල්ලන්ද බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉතිරි ඉදිකිරිම් නිම කිරීම.**

නුවරඑළිය කොත්මලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මල්ලන්ද වසමේ ඉදිකෙරෙන මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරිම් ද අවසන් කර නොතිබීම හේතුවෙන් 2011 වර්ෂයේ දී නැවත ආරම්භ කරන ලද අතර දැනට 60% ට වැඩි ප්‍රමාණයක් නිම කර ඇත. ඉතිරි ඉදිකිරීම් කඩිනමින් අවසන් කර ජනතාව වෙත පවරාදීමට නියමිතය. ඇස්තමේන්තු මුදල රු. මිලියන 1.80ක් වන මෙයින් ද ජනතාවගේ පොදු කටයුතු සඳහා ඒකරාශී වීමට නව ස්ථානයක් ලැබීමෙන් ඔවුන්ගේ පොදු කටයුතු සඳහා පහසුවක් සැලසෙනු ඇත.

**3) ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණදීමට සිදුවූ දුෂ්කරතා**

ඉහත ඉදිකිරීම් කටයුතුවල දී විවිධ අඩුපාඩු හා දුෂ්කරතාවයන් මතු විය. ඒ අනුව,

01. අදාළ වර්ෂය තුළදී ව්‍යාපෘතීන් කිහිපයක් නිම කිරීමට නොහැකි වීමෙන් අවිච්ඡේද වීම.
02. ව්‍යාපෘතිය කරගෙන යන සෑම අවස්ථාවකදීම අධීක්ෂණ සහාය හිගවීම.
03. ගෙවීම් කිරීමේදී බිල්පත් ලැබීම් ප්‍රමාද වීම්.
04. ව්‍යාපෘතිය සඳහා වර්ෂය ආරම්භයේ දී ප්‍රතිපාදන නොලැබීම නිසා වර්ෂය අවසානයේ දී ව්‍යාපෘතිය නිම කිරීමේ දුෂ්කරතා.
05. අපේක්ෂිත කාලය තුළ දී ව්‍යාපෘතීන් පහත හේතූන් නිසා නිම කිරීමට නොහැකි දුෂ්කරතා මතුවිය.
    I. කාලගුණික බලපෑම
    II. සැලසුම් වෙනස් වීම හා ඇස්තමේන්තු සංශෝධනය වීම
    III. පුහුණු කම්කරු හිගය
06. ප්‍රායෝගික ගැටලු සහ වෙනත් විවිධ ප්‍රශ්න පැනනැගීම නිසා විවිධ බාධා ඇතිවීම.

මෙම දුෂ්කරතා මධ්‍යයේ වුව ද 2011 වසරේ ඉලක්කගත සංවර්ධන ව්‍යාපෘතීන් 90% ක් පමණ නිම කිරීමට හැකිවිය.

# මූල්‍ය කළමණාකරණ අංශය

**2011 දෙසැම්බර් 31 දිනට**
**ශේෂ පත්‍රය**

| | 2011<br>රු.ශත | 2010<br>රු.ශත |
|---|---|---|
| **වත්කම්** | | |
| දේපළ.පිරියත හා උපකරණ | 28,566,391.59 | 31,429,932.77 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 411,838.45 | 262,343.15 |
| ස්ථාවර තැන්පතු | 5,863,157.13 | 5,000,000.00 |
| විවිධ ණය ගැතියෝ | 203,550.00 | 403,950.00 |
| ලැබිය යුතු තැන්පතු | - | 105,000.00 |
| ලැබිය යුතු වක්‍රිය අරමුදල් | 6,151,455.01 | 6,382,743.25 |
| අත්තිකාරම් | - | 6,400.00 |
| මුදල් ශේෂය - i | 53,513,849.01 | 54,078,972.42 |
| මුදල් ශේෂය - ii | 953,829.51 | 2,058,356.03 |
| තැන්පතු | - | 75,000.00 |
| ලැබිය යුතු අරමුදල් ගිණුම | - | 103,408,269.85 |
| ලැබිය යුතු අත්තිකාරම් | 55,000.00 | 80,025.04 |
| **මුළු වත්කම්** | **146,834,761.07** | **203,290,992.51** |
| **ජංගම වගකීම්** | | |
| රදවාගැනීම් | 1,082,489.78 | 877,546.33 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 895,152.50 | 1,093,447.08 |
| උපචිත වියදම් | 636,650.85 | 621,406.76 |
| විවිධ ණය හිමියෝ | | 108,855.84 |
| රදවා ගැනීම් බදු | 4,400.00 | 20,961.21 |
| ගෙවිය යුතු අවිච්ඡේද | 50,127,342.70 | 137,727,371.22 |
| ගෙවිය යුතු තැන්පතු | 1,565,000.00 | 1,565,000.00 |
| සේවක ඇප තැන්පතු | 60,500.00 | 19,500.00 |
| වෙනත් ගෙවීම් | - | 89,000.00 |
| ශුද්ධ වත්කම් | **42,463,225.24** | **61,167,904.06** |
| **හිමිකම් හා වගකීම්** | | |
| රාජ්‍ය ප්‍රතිපාදන ගිණුම | 28,944,324.92 | 31,807,866.09 |
| අතිරික්තය / ඌණතාවය | 63,518,900.32 | 29,360,037.97 |
| | **92,463,225.24** | **61,167,904.06** |

**2011 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා**

**ආදායම් වියදම් ප්‍රකාශය**

| | 2011 | 2010 |
|---|---|---|
| | රු.ශත | රු.ශත |
| **අරමුදල් ලැබීම්** | | |
| භාණ්ඩාගාරය - ප්‍රාග්ධන ලැබීම් | 213,787,035.00 | 301,069,044.70 |
| - පුනරාවර්ථන ලැබීම් | 22,908,190.00 | 20,889,000.00 |
| විවිධ ආදායම් | 1,338,661.85 | 2,353,604.78 |
| රාජ්‍ය ප්‍රතිපාදන ගිණුම | 3,076,506.17 | 3,592,101.01 |
| චක්‍රිය අරමුදල | 1,009,470.00 | |
| **මුළු ලැබීම්** | **242,119,863.02** | **327,903,750.49** |
| **මෙහෙයුම් වියදම්** | | |
| පුද්ගල පඩිනඩි | 15,491,867.68 | 14,372,109.82 |
| ගමන් වියදම් | 385,272.59 | 504,973.30 |
| සැපයීම් හා වෙනත් | 1,591,099.62 | 2,103,999.39 |
| නඩත්තු වියදම් | 3,612,108.77 | 3,842,763.10 |
| ගිවිසුම්ගත සේවා | 1,331,050.98 | 1,251,082.46 |
| ක්ෂය | 3,076,506.17 | 3,592,101.01 |
| වෙනත් මෙහෙයුම් වියදම් | 3,072,808.46 | 2,481,791.69 |
| සංවර්ධන වියදම් | 207,879,862.15 | 292,193,041.90 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **236,440,576.42** | **320,341,862.67** |
| අතිරික්තය/ ඌණතාවය- මෙහෙයුම් | 5,679,286.60 | 7,561,887.82 |
| ඉ/ගෙ ශේෂය | 57,839,613.72 | 21,798,150.15 |
| මුළු අතිරික්තය/ ඌණතාවය | **63,518,900.32** | **29,360,037.97** |

2010 වර්ෂයේ මූල්‍ය කළමණාකරන අංශයේ ශේෂ පත්‍රය පිරික්සීමේ දී දේපළ,පිරියත, හා උපකරණවල අගය වැඩිවීමක් සිදු වී නොමැත. 2011 වර්ෂයේ ලීබඩු හා උපකරණ පමණක් මිලදී ගැනීම් සිදු කර ඇත. එසේම 2011 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය රු.මි.3.076 කි.

චක්‍රිය අරමුදල මගින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර තැන්පතුව 2010 වසරට වඩා රු.863.157.13 කින් වැඩි වී ඇත.

2010 වර්ෂය හා සසදා බැලීමේ දී ගෙවිය යුතු සංවර්ධන වියදම්වල විශාල අඩුවීමක් දක්නට ඇත. මෙයට හේතු වශයෙන් ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති යටතේ වැඩි ව්‍යාපෘති සංඛ්‍යාවක් ක්‍රියාත්මක කිරිම හා 2011.12.31 දින වන විට ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය විසින් ළද රු.මි 213 න් රු.මි 191.438 ක මුදලක් ගෙවා අවසන් කිරීමට හැකි වීමයි. ඒ හේතුවෙන් 2012 වසරට අඛණ්ඩ හා බැදීම් ගත වූ ව්‍යාපෘතිවල වටිනාකම වූයේ රු.මි 50,127 කි.

2011 වසරේ භාණ්ඩාගාරයෙන් අනුමත කරන ලද ප්‍රාග්ධන මුදල රු.මි 300 කි.2011 වසරේ එම අනුමත ප්‍රාග්ධන මුදලින් රු.මි 213 ක් ලැබිණි. සාපේක්ෂ ප්‍රාග්ධන ලැබීම්වල ප්‍රතිශතය 71% කි.

එසේම පුනරාවර්ථන ලැබීම්වල වැඩිවීම පසුගිය වසරට සාපේක්ෂව රු.මි.2.01 කි. එය ප්‍රතිශතයක් ලෙස 9.6 % කි.

**<u>මූළ්‍ය වියදම</u>**

| අනු අංකය | විස්තරය | 2011 | 2010 |
|---|---|---|---|
| 1 | පුනරාවර්තන වියදම් | 23,795,572.00 | 24,556,719.76 |
| 2 | සංවර්ධන වියදම් | | |
| 2.1 | ගම නැගුම | | |
| | භෞතික හා යටිතල පහසුකම් සංවර්ධනය | - | 140,995,227.80 |
| | අධ්‍යාත්මික හා ජීවනෝපාය සංවර්ධනය | 137,074,342.65 | 3,125,478.08 |
| 2.2 | විශේෂ ව්‍යාපෘති (ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය) | 11,212,610.45 | 5,640,478.66 |
| 2.3 | පරිපාලන වියදම් | 8,534,626.93 | 4,704,487.00 |
| 3 | ස්ථාවර වත්කම් අත්පත් කරගැනීම හා පුනරුත්ථාපනය | 212,965.00 | 1,156,867.37 |
| 4 | අඛණ්ඩ ගෙවීම් හා බැදීම්ගත ගෙවීම් | 81,031,682.44 | 39,682,357.78 |
| | **එකතුව** | **261,861,799.47** | **219,861,616.45** |

## පුනරාවර්ථන වියදම්

| අනු අංකය | විස්තරය | 2011 | % | 2010 | % |
|---|---|---|---|---|---|
| 1 | පුද්ගලික පඩිනඩි | 15,391,718.00 | 64.68 | 14,372,109.82 | 58.53 |
| 2 | ගමන් වියදම් | 522,711.84 | 2.20 | 504,973.30 | 2.10 |
| 3 | සැපයීම් හා සේවා | 3,204,353.24 | 13.47 | 2,103,999.39 | 8.57 |
| 4 | නඩත්තු | 2,312,751.91 | 9.72 | 3,842,763.10 | 15.65 |
| 5 | ගිවිසුම් ගත සේවා | 2,364,037.56 | 9.93 | 1,251,082.46 | 5.13 |
| 6 | වෙනත් | - | | 2,481,791.69 | 10.02 |
| | **එකතුව** | 23,795,572.00 | 100.00 | 24,556,719.76 | 100.00 |

2011 වසරේ පුනරාවර්ථන වියදම් රු.මි 23.795 කි. 2010 වසර හා සසදා බලන විට එය රු.මි 0.761 ක අඩු වීමකි. පෞද්ගලික පඩිනඩි ගෙවීම සඳහා රු.මි 15.391 ක වියදමක් 2011 වසරේදී දරන ලදී. එය ගිය වසරට සාපේක්ෂව රු.මි 1.019 ක වැඩි වීමකි. මෙම වැඩි වීමට හේතු ලෙස විශේෂයෙන් සඳහන් කල යුතු වන්නේ කළමණාකරන සේවා චක්‍රලේඛ 30(1) ට අනුව හිඟ වැටුප් ගෙවීම සිදු කිරීම. ජීවන වියදම් දීමනාව වැඩිවීම සහ සහකාර අධ්‍යක්ෂ (පශුසම්පත්) තනතුර සඳහා බඳවා ගැනීම 2011 වසරේ සිදු කිරීම යන කරුණු සඳහන් කළ හැකිය.

2010 වසර හා සාපේක්ෂව සසදා බලන විට සැපයීම් හා සේවා සඳහා වැය කරන ලද මුදල රු.මි 1.1කින් වැඩි වී ඇත. ඉන්ධන මිල ඉහළ යාම. කළමණාකරන මණ්ඩල දීමනා ඉහළ යාම සහ සියලුම භාණ්ඩ හා සේවා මිල 2010 වසරට සාපේක්ෂව ඉහළ ගොස් තිබීම මෙයට හේතු ලෙස දැක්විය හැකියි. එසේම ගිවිසුම්ගත සේවා සඳහා වන වියදම 2011 වසරේ දී රු.මි 1.331 කි.මෙය 2010 වර්ෂය හා සසදා බැලීමේදී රු.මි.0.008 ක වැඩිවීමකි. ජල විදුලිය ඉහලයාම, ඉන්ධන මිල ගණන් වැඩි වීම, කුලී හා බදු මුදල් ඉහළ යාම හා වාහන රක්ෂණ කටයුතු සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු වීම මීට හේතු ලෙස දැක්විය හැක.

2011 වර්ෂයේ කඩුගන්නාව වෙළඳ සංකීර්ණයෙන් ලද ආදායම රු.මි. 0.668 කි. එය 2010 වසරට සාපේක්පව රු.මි. 0.25 ක වැඩිවීමකි. විශේෂයෙන් කඩුගන්නාව වෙළඳ සංකීර්ණයේ අයනොවූ කඩකාමර කුලී සිහිකැඳවීම් ලිපි මගින් ලබා ගැනීමට හැකිවීම හා කඩකාමර කුලී නොගෙවූ අංක 09 හා 10 යන කඩකාමර නැවත බෙදා දීම සිදුවීම මෙයට හේතු ලෙස දැක්විය හැක. එසේම බෙලිහුල්ඔය දියපහස ගිමන්හලෙන් රු.17.532.12 ක ආදායමක් 2011 වසරේ දී ලබා ගැනීමට හැකිවිය.

එසේම 2011 වසරේ පේරාදෙණිය උද්භිද උද්‍යානයේ පැල අලෙවි සැලක් ආරම්භ කිරීම ද විශේෂයෙන් සඳහන් කළ යුතුය. දිවි නැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක කෙරෙන මෙම අලෙවි සැලෙහි 2011.12.31 දිනට ශුද්ධ ලාභය රු 77.695 කි.

# සංවර්ධන වියදම්

01) යටිතල පහසුකම් සංවර්ධනය

| අනු අංකය | ප්‍රාද්ශීය ලේකම් කොට්ඨාශය | 2011 | % | 2010 | % |
|---|---|---|---|---|---|
| 1 | පූජාපිටිය | - | - | 30,874,193.07 | 21.90 |
| 2 | අකුරණ | - | - | 19,152,013.50 | 13.58 |
| 3 | හාරිස්පත්තුව | - | - | 44,092,482.02 | 31.28 |
| 4 | හතරලියද්ද | - | - | 19,731,683.70 | 13.99 |
| 5 | ගලගෙදර | - | - | 27,144,855.57 | 19.25 |
| | | **-** | **-** | **140,995,227.80** | **100.00** |

යටිතල පහසුකම් සංවර්ධනය යටතේ 2010 වර්ෂයේ රු.මි. 140.995 ක වියදමක් දරා ඇත. නමුත් 2011 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය යන සංරචක 02 යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක වීම සිදු වීම හේතුවෙන් ඉහත වගුවෙහි 2011 වර්ෂයට යටිතල පහසුකම් සංවර්ධනය යටතේ පිරිවැයක් සටහන් කර නොමැත.

**02) ජීවනෝපාය මාර්ග වැඩිදියුණු කිරීම හා ආධ්‍යාත්මික සංවර්ධනය**

| අනු අංකය | ප්‍රාද්ශීය ලේකම් කොට්ඨාශය | 2011 | | 2010 | |
|---|---|---|---|---|---|
| | | ජීවනෝපාය සංවර්ධනය | ආධ්‍යාත්මික සංවර්ධනය | ජීවනෝපාය සංවර්ධනය | ආධ්‍යාත්මික සංවර්ධනය |
| 1 | පූජාපිටිය | 109,567,663.21 | 27,506,679.44 | 2,202,583.81 | 922,894.27 |
| 2 | අකුරණ | | | | |
| 3 | හාරිස්පත්තුව | | | | |
| 4 | හතරලියද්ද | | | | |
| 5 | ගලගෙදර | | | | |
| | **එකතුව** | **109,567,663.21** | **27,506,679.44** | **2,202,583.81** | **922,894.27** |

ජීවනෝපාය සංවර්ධනය හා ආධ්‍යාත්මික සංවර්ධනය පිළිබඳ සදහන් කිරීමේ දී 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේ සැලකිය යුතු වර්ධනයක් දැකිය හැකිය. විශේෂයෙන්ම 2011 වර්ෂයේ ජීවනෝපාය හා අධ්‍යාත්මික සංවර්ධනය යන සංරචක 02 යටතේ පමණක් ව්‍යාපෘති ක්‍රියාත්මක වීම මෙයට හේතුව ලෙස සඳහන් කළ හැකිය. සියලුම ඇළවේලි, කෘෂි මාර්ග ඉදිකිරීම් ජීවනෝපාය සංවර්ධනය යන සංරචකය යටතේ සිදු කිරීම හේතුවෙන් 2010 වසරට සාපේක්ෂව 2011 වර්ෂයේ ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ පිරිවැය සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කරයි. 2010 වසරට සාපේක්ෂව අධ්‍යාත්මික සංවර්ධන ව්‍යාපෘති වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක කිරීම හා ඒ සඳහා මුදල් නිදහස් කිරීම 2011 වසරේ දී සිදුවිය. විශේෂයෙන්ම සනීපාරක්ෂක පහසුකම් ලබා දීම, දහම් පාසැල් හා කලායතන සඳහා උපකරණ ලබා දීම මෙහි දී විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## 2010 වර්ෂයේ ගිණුම් අංශය මගින් ඉටු කරන විශේෂ කාර්යන්

01. පසුගිය වසරවල අයකර ගැනීමට නොහැකි වූ වක්‍රිය අරමුදල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරීන් මගින් එකතු කිරීමේ නව වැඩ පිළිවෙලක් හඳුන්වා දෙනු ලැබීය. මෙමගින් මිලියන 07කට ආසන්න මුදලක් අයකර ගැනීමට හැකිවිය.

02. කළමණාකරණ සේවා චක්‍රලේඛ 30(1) ට අනුව හිඟ වැටුප් ගෙවීමට කටයුතු කිරීම හා සේවකයින් නව වැටුප් තලවල පිහිටුවීමට කටයුතු කිරීම.

03. රාජ්‍ය ආයතනයක රාජකාරි, කාර්යයන් නිවැරදිව ඉටුකිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩලය දැනුවත් කරමින් ගිණුම්කරණය පිළිබඳ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

## 2.11 විගණන වාර්තාව

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
**கணக்காய்வாளர் தலைமை அதிபதித் திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

මගේ අංකය / எனது இல / My No. සීඑල්/කේඩී/එච්/යූඩීඒ/2011-එෆ්ඒ/2012/13

ඔබේ අංකය / உமது இல / No.

දිනය / திகதி / Date 2012 ඔක්තෝබර් 16 දින

සභාපති
ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය.

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය පනතේ 25 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 ජූලි 12 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල , ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி 2887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. 011-2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. oaggov@sltnet.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ විගණනය මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට උඩරට සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් මස ලියන ලද එහෙත් අදාල භාණ්ඩ නොසැපයීම හේතුවෙන් 2012 පෙබරවාරි 28 දින වන විටත් නිකුත් කර නොතිබූ රු.25,145,466 ක් වටිනා චෙක්පත් 16 කින් රු.20,756,690 ක් වටිනා චෙක්පත් 05 ක් අවලංගු කර තිබුණි. එම චෙක්පත්වල වටිනාකම වර්ෂයේ වියදමට ඇතුළත් කර තිබීමෙන් වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට සංවර්ධන කාර්යයන් නිම කිරීම පිණිස භාණ්ඩාගාරයෙන් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබුණු රු.53,513,844 ක මුදල් ශේෂයක් තිබියදී එය නොසලකා අවිච්ඡේද හා බැරකම් සඳහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු සේ සලකා රු.50,000,000 ක මුදලක් ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් ජංගම වත්කම් (ලැබිය යුතු අරමුදල්) සහ සමුච්චිත අරමුදල වැඩියෙන් දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ සිදු කිරීමට අපේක්ෂා කරන ලද එහෙත් කිසිදු වියදමක් නොදරන ලද වටිනාකම රු.32,478,637 ක් වූ කර්මාන්ත 158 ක් පසු වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමේ අපේක්ෂාව මත ඊට අදාල මුළු වටිනාකම වර්ෂයේ සංවර්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඈ) අංක 56-6504 හා අංක 254-0401 දරන වාහන 2 ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් පරිත්‍යාග ලෙස ලැබී තිබුණද ස්ථාවර වත්කම් සහ රාජ්‍ය ප්‍රදාන යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

*පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.*

| නීති, රීති, රෙගුලාසි හා කළමණාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2005 අංක 26 දරන ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාර්ය පනතේ 3(1) වගන්තිය | අධිකාර්ය සතු බල ප්‍රදේශය දිස්ත්‍රික්ක 08 ක් තුළ ව්‍යාප්ත වී තිබුණද, සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක සැලසුම් අනුව එය මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීයලේකම් කොට්ඨාශ 05 කට පමණක් සීමාවී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ | |
| | i. මු.රෙ.237 | භාණ්ඩ හෝ සේවා ලැබී ඇති බවට තොග සහතිකයකින් තොරව ගෙවීම් අනුමත කිරීම/සහතික කිරීම නොකළ යුතු වුවද රු.23,345,466 ක් වටිනා ගෙවීම් වවුචර් 16 කට අදාලව භාණ්ඩ ලැබී නොතිබියදී ගෙවීම් අනුමත කර සහතික කිරීමකින් ද තොරව චෙක්පත් ලියා තිබුණි. |
| | ii. මු.රෙ.212 (2) | වැටුප් අත්තිකාරම් ලබාදිය හැක්කේ මාසික වැටුපෙන් 40% ක සීමාවට යටත්ව පමණක් වුවද ඊට පටහැනිව නිලධාරීන් දෙදෙනෙකු සඳහා 51% සිට 68% දක්වා වැටුප් අත්තිකාරම් ලබාදී තිබුණි. |

### 2.2.3 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පවත්වාගෙන ගිය කිරිහල වසාදැමීම නිසා බදුකරුගෙන් අයවිය යුතුව තිබූ රු.107,500 ක බදු කුලී අදාල ණයගැති ගිණුමෙන් කපාහැර තිබූ අතර, ඒ සඳහා කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද සභාපතිවරයාගේ පිළිතුර පරිදි නීත්‍යානුකූල කටයුතු කර අදාල මුදල අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව සඳහන් වන හෙයින් ඉහත පරිදි ගිණුමෙන් කපා හැරීම යෝග්‍ය නොවන බව තහවුරු වේ.

### 2.2.4 ද්‍රව්‍ය අක්‍රමිකතා/අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) දිවි නැගුම ගෘහ ආර්ථික ඒකක ව්‍යාපෘතිය යටතේ හඳුනාගත් පැල අවශ්‍යතාවය 5100 ක්ව තිබියදී නිසි පදනමකින් තොරව රු.306,000 ක් වටිනා පැල 10200 ක් මිලදී ගැනීම නිසා වැඩිපුර ලබාගත් පැල ක්ෂේත්‍රගත කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොතිබීමෙන් පාසැල් වල ගුරු භවතුන් හා ළමුන් අතර බෙදාදීමට සිදුව තිබුණි.

(ආ) දිවි නැගුම සංවර්ධන වැඩසටහනට සමගාමීව සත්ව පාලන වැඩසටහන සඳහා කුකුළු පැටවුන් 3,024 ක් අවශ්‍යව තිබියදී නිශ්චිත පදනමකින් තොරව කුකුළු පැටවුන් 6000 ක් ඇනවුම් කිරීම හේතුවෙන් රු.892,800 ක් වටිනා කුකුල් පැටවුන් 2,976 ක් වැඩිපුර ලබා ගෙන තිබුණි. 2011 දෙසැම්බර් 31 දින වන විට එම කුකුල් පැටවුන් ලැබී නොතිබුණද රු.1,800,000 ක් වූ මුළු වටිනාකම ගිණුම්ගත කොට චෙක්පත් ලියා තිබුණි. 2012 අප්‍රේල් වන විට එයින් පැටවුන් 1616 ක් පමණක් ලැබී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් කටයුතු වලින් රු. 5,679,287 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා වූ අතිරික්තය රු. 7,561,888 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.1,882,601 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන වියදම් වැඩිවීම, පුද්ගල පඩිනඩි ගිවිසුම්ගත සේවා ඇතුළු වියදම්වල වැඩිවීම මෙම පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

සමාලෝචිත වර්ෂය තුල ප්‍රධාන අංශ 04 ක් යටතේ රු.මි. 300 ක් වූ සංවර්ධන කාර්යයන් 1147ක් ඉටු කිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද ඉටු කර ගැනීමට හැකිවී තිබුණේ රු.මි.210 ක් පමණක් වූ කාර්යයන් වන අතර එහි ප්‍රතිශතය 70% ක් පමණ විය. මෙම වාර්තාවේ 2.2.3(අ) ජේදයේ සඳහන් කරුණු සැලකිල්ලට ගත්විට සමාලෝචිත වර්ෂය සඳහා වූ භෞතික ප්‍රගතිය රු.මි. 185 ක් එනම් 61% ක් පමණ විය.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කහ සහ ඉඟුරු වගා කටයුතු ව්‍යාප්ත කිරීමේ අරමුණින් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ නිර්දේශිත කහ, ඉඟුරු බෙදාදීමට කටයුතු යොදා තිබියදී ඉන් බැහැරව පිළිගත් සහතික කිරීමකින් තොරව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි නොවූ පුද්ගලික තවාන් කරුවකුගෙන් කහ සහ ඉඟුරු බීජ කි.ග්‍රෑ.7027 ක් වැඩි මිලට මිලදී ගැනීම හේතුවෙන් ආයතනයට රු.262,300 ක අලාභයක් සිදුව තිබුණු අතර එකී බීජ බහුතරයක් පැල නොවීම, කුණුවීම හා පසුව විනාශවීම යනාදී කරුණු හේතුවෙන් කහ/ඉඟුරු බීජ වෙනුවෙන් අධිකාරියට අයවිය යුතු (චක්‍රීය අරමුදල යටතේ ලබාදුන්) 50% ක වාරික මුදල් නිසි පරිදි අය කර ගෙනද නොතිබුණි.

(ආ) කඩුගන්නාව වෙළඳ සංකීර්ණයට අයත් කඩ කාමර 02 ක් කිරි ගොවි සමිතියක් හා මීමැසි පාලන සමිතියක් ලෙස සඳහන් කර සමාලෝචිත වර්ෂය තුල බදු දී තිබුණද එම කඩකාමර වෙනුවෙන් ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල වූ රු.200,000 ක් ලබාගෙන නොතිබුණු අතර වැඩිදුර පරීක්ෂා කිරීමේදී මෙවැනි කිරිගොවි සමිතියක් පළාත් සත්ව නිෂ්පාදන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී නොමැති බව එහි අධ්‍යක්ෂ විසින් තහවුරු කර තිබුණි.

## 4.3 ආර්ථික නොවූ ගනුදෙනු

ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 03 ක ස්වයං රැකියා ලාභීන් වෙනුවෙන් රූපලාවන්‍ය උපකරණ සැපයීම සඳහා රු.2,338,590 ක් වැය කර තිබුණු අතර උපකරණ මිලදී ගැනීම පිණිස ආයතන 04 කින් මිල ගණන් කැඳවා තිබුණි. මිලදී ගැනීමට අපේක්ෂිත භාණ්ඩ වලට අදාල පිරිවිතර කලින් නිර්ණය කර නොතිබීම, එක් පුද්ගලයෙකු විසින් ඉදිරිපත් කළ ව්‍යාජ මිල ගණන් 03 ක් පදනම් කරගෙන මිලදී ගැනීම, ඇතැම් ආභරණ භාවිතයට නුසුදුසු ඒවා බවට අදාල ප්‍රතිලාභීන් තහවුරු කර තිබීම, හේතුවෙන් එම ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටුවී නොමැති බව නිරීක්ෂණය විය.

## 4.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තියට සංශෝධිත 2011 මාර්තු 09 දිනැති ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය පරිදි ප්‍රාදේශීය ලේකම්වරයා සහ දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් නම් කරනු ලැබූ නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත කමිටුවක් මගින් තෝරාගත් අනුමත සමිතියකට රු. මි. 2 ක් දක්වා වූ කොන්ත්‍රාත් ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දිය හැකි වුවද, ඇස්තමේන්තුගත වටිනාකම රු. 13,894,175 ක් සහ රු. 3,204,882 ක් වූ නාරංගස්පිටිය විවල පාලම සහ සිත්තෝඩය පාලම යන කොන්ත්‍රාත් එම සීමාව පිළිබඳව සැලකිලිමත් නොවී අනුමත සමිති 02 කට ලබා දී තිබුණි. එසේම, මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(11) උප වගන්තිය පරිදි එම සමිති සඳහා බැංකු ඇපකරයකින් තොරව අත්තිකාරම් ලබා දිය හැකි රු. 200,000 ක උපරිම සීමාව ඉක්මවා රු. 2,135,894 ක සහ රු. 288,549 ක අත්තිකාරම් අවිධිමත් පරිදි ගෙවා තිබුණි.

(ආ) ඇස්තමේන්තුගත වටිනාකම රු.1,015,944 ක් වූ පේරාදෙණිය උද්භිද උද්‍යානය තුල 18’x25’ ප්‍රමාණයේ පැල අලෙවිසැලක් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව අදාල ඉඩම පවරා නොගෙන , විධිමත් ගිවිසුමකින් තොරව සහ ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමකින් තොරව පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයට පටහැනිව සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව 20% අත්තිකාරම් රු.199,560 ක් ගෙවා තිබුණි. වැඩ අයිතමයන් 05 කට අදාලව රු.220,904 ක අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබුණු අතර ප්‍රමිතීන්ට අනුකූලව හා නිසි නිමාවකින් යුතුව එම ඉදිකිරීම නිම නොකිරීම හේතුවෙන් කරන ලද වැඩ වෙනුවෙන් ගෙවීම් අත්හිටුවා තිබුණි.

(ඇ) හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාපාමඩුල්ල වසමේ කෙහෙල් දෙණිය පිට ඇල සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාලව එහි ඇල පතුල අඟල් 06 ක් ගණකමට කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද ඉතා දුර්වල මිශ්‍රණයකින් යුතුව අඟල් 02 ක ගණකමකින් කොන්ක්‍රීට් යෙදීම නිසා එහි පැවැත්ම අවිනිශ්චිත වන අතර ඊට අදාලව නොකළ වැඩ වෙනුවෙන් රු.154,017 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම ඇල ඉදිකිරීම සඳහා පස් කැපීමට වැඩිපුර ඇස්තමේන්තු කර රු.21,695 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ඈ) අකුරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අලවතුගොඩ වසමේ පොල්දෙණිය යාය කුඹුරේ ඇල සංවර්ධනය කිරීම සඳහා රු.731,000 ක මුදලකට ගිවිසුම් ගතවී තිබුණි. ඇලේ ධාරිතාවයට ප්‍රමාණවත් ඝණකමකින් හා සවිමත් බවකින් තොරව අඟල් 4 ගණකමින් ඇල බිත්ති සැලසුම්කර තිබීම, ඊට වඩා අඩු ඝණකමින් හා දුර්වලව ඇල පැති බැම් නිමකර තිබීම, වැර ගැන්වීමට යොදන ලද කම්බි නිරාවරණය වූ ස්ථාන පැවතීම, ඇතැම් ස්ථානවල අඟල් 3.25 කට වඩා අඩු ඝණකමින් පැවතීම වැනි කරුණු හේතුවෙන් ඇලේ පැවැත්ම කෙටි කාලීන වීමද ඇල පතුල සඳහා නොකළ වැඩ වෙනුවෙන් රු.77,466 ක් වැඩිපුර ගෙවීම්ද සිදුකර තිබුණි.

(ඉ) අවලංගු කළ කර්මාන්ත
-------------------------

සමාලෝචිත වර්ෂයේ ආරම්භ කර තිබූ ඇස්තමේන්තු ගත වටිනාකම රු.1,398,699 ක් වූ කර්මාන්ත 07 ක් 2012 වසරට අවිච්ඡේද කර තිබුණු අතර ඉන් කර්මාන්ත 02 ක් සඳහා රු.43,620 ක අත්තිකාරම් මුදල්ද ගෙවා තිබුණද, පසුව එකී කර්මාන්ත 07 ම අවලංගු කර තිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය
-----------------------------

නිසි සුදුසුකම් පරීක්ෂා කිරීමකින් තොරව අධ්‍යක්ෂ සංවර්ධන සහ ඉංජිනේරු යන තනතුරු සඳහා නිලධාරීන් බඳවා ගෙන තිබුණි.

4.6 වාහන උපයෝජනය
----------------------

(අ) ආයතනය සතු පැරණි වාහන 03 ක් වර්ෂ 01 කට අධික කාලයක සිට කාර්යාල පරිශ්‍රය තුළ නිෂ්ක්‍රියව පැවතුණි.

(ආ) වාහන 15 කට අදාලව 2012 ජනවාරි සිට 2012 අප්‍රේල් දක්වා මාස 04 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතු භාවය සහ යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් 2008-2012 දක්වා පස් අවුරුදු කාලයකට අදාලව සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණද කාලානුරූපව සමාලෝචනය කර යාවත්කාලීන කර නොතිබුණි. සංයුක්ත සැලැස්මෙහි අරමුණු ගත කාර්යන් බහුතරයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

### 5.2 ක්‍රියාකාර් සැලැස්ම

ක්‍රියාකාර් සැලැස්මේ ඇතුළත් ග්‍රාම නිලධාර් කොට්ඨාශ පදනම් කර ගත් රු.මි. 300 ක වටිනාකමින් යුත් විවිධ කර්මාන්ත හා කාර්යයන් 1147 ක් ඇතුළත් වුවද ඒ එක් එක් කර්මාන්ත ඇස්තමේන්තුගත අගයන් දැක්වෙන පරිදි සවිස්තරාත්මකව දක්වා නොතිබුණි.

### 5.3 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

### 5.4 ප්‍රසම්පාදන සැලැස්ම

වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර ඇතත් එය තාත්වික පදනමෙන් යුතුව පිළියෙල කර නොතිබූ අතර එකී සැලැස්ම යාවත්කාලීන කිරීමක් හෝ පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගැනීමක් සිදු කර නොතිබුණි.

### 5.5 අයවැය පාලනය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 08 කට අදාලව 16% සිට 99% දක්වා ප්‍රතිපාදන වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණු අතර වැය විෂයයන් 08 ක ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් 38% සිට 312% දක්වා ප්‍රතිපාදන වෙනත් විෂයන්ගෙන් මාරු කර ගෙන තිබුණි.

(ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 6 ක 29% සිට 100% දක්වා එනම් රු. 123,522,256 ක ඉතිරියක් පැවතුණි.

6. පද්ධති හා පාලනයන්

විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පද්ධති හා පාලන පිළිබඳ ඌනතා වරින් වර මාගේ වාර්තා මගින් පෙන්වා දී ඇත. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

(අ) අභ්‍යන්තර විගණනය
(ආ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
(ඇ) ගබඩා පාලනය
(ඈ) වාහන පාලනය
(ඉ) වැටුප් අත්තිකාරම් ගෙවීම
(ඊ) කොන්ත්‍රාත් පරිපාලනය
(උ) ගිණුම් පොත් පත් පවත්වා ගැනීම

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති